# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ මැදින් පුර අටවක පෝදා 2023 පෙබරවාරි 27 සඳුදා BUDUSARANA MONDAY FEBRUARY 27, 2023
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 36 පත්‍රය , ආරම්භය 1965 - 06 - 13



දොඩංදූව ශෛලබිම්බාරාම විහාරයේ සෑ රදුන් වහන්සේ

සේයාරුව - නිශ්ශංක විජේරත්න

# පාපය සැඟවුව ද විපාකයෙන් ගැලවීමක් නැත

**කරන පවු හෙළිවනවාට කිසිවෙක් අකැමැති ය. පවුකම් කොට ඒවා සැඟවීමේ ස්වභාවය මායා නම් වේ.**

වත්මන් සමාජයේ බහුතරයක් මිනිසුන්ගේ ජීවිතවලට බොහෝ දුක් ගෙන දෙන ක්ලේෂ යක් ලෙස මායාව හඳුන්වාදිය හැකි ය. තමන් තුළ නැති ගුණ ඇතැයි සිතමින්, කියමින්, මවා පෙන්වමින් සිත අපිරිසුදු කර ගැනීම මානයෙන් පෙළෙන පුද්ගලයාගේ සිරිතයි.

මෙය කවුරුන් විසින් හෝ අප වෙත ලබා දෙන අවගුණයන් නොව අවිද්‍යාව නිසා අප විසින් ම අප තුළ ගොඩනඟා ගන්නා අකුසල ධර්මයෙකි.

රාත්‍රී කාලයේ දී ගෙයක් බිඳ දේපළ පැහැර ගන්නා සොර දෙටුවා ම සොරා සොයා ගැනීමට පොලිසියට උදවු කළ අවස්ථා ගැන අප මාධ්‍ය තුළින් කොතෙකුත් අසා ඇත්තෙමු. මනුෂ්‍ය ඝාතකයන් ද ඇතැම් විටෙක අපරාධය හෙළිදරව් වන තුරුම සුදනන් සේ ජීවත් වෙති. එහෙත් තමන් විසින් කරන ලද පවුකම් වසන් කරමින් ඔවුනට කොපමණ කලක් ජීවත් විය හැකි දැයි විමසා බලනවිට ඒ කාල සීමාව ඉතාම කෙටි බව ඔබත් අත් විඳ ඇතැයි සිතමි. සමාජයෙන් මොන තරම් කෙටිකාලීන පැසසුම් ලද්දේ ද මායාව නමැති ක්ලේෂයෙන් යම් අපරාධයක් කළ මොහොතේ පටන් ඔහුට ගැලවීමක් නැත්තේ ම ය. හදවතින් විඳවමින්, ගැහෙමින්, තැවෙමින්, දැවෙමින් බයෙන් ජීවත් වී අවසානයේ දී මෙලොව දී ම රාජ දණ්ඩනයන් ලබා අවසානයේ දී පරලොව ද දුගතිගාමී වන්නේ ම යැයි අප තථාගතයන් වහන්සේ තුන්කල් දකින නුවණින් දේශනා කොට වදාළ සේක.

ජංගම දුරකතනය, ඇඳුම පැළඳුම, යතුරුපැදිය, වාහනය වැනි තරුණයන්ගේ මායාවන්ට හසු වී ජීවිතය ම අඳුරු කර ගන්නා තරුණියන් කොතෙක් නම් අප අතර වේ ද? සම්බුද්ධ දේශනාව ඇසුරු කළ බොදු දරුවන් මෙකී විනාශකාරී මායා නම් ක්ලේශය හඳුනා ගන්නා බැවින් එවන් අනතුරක නම් කිසිදාක නොවැටෙත්, මන්දයත් තමන් වෙත සැබැවින් ම නැති දේ මවාපාන දුර්ජනයා ප්‍රඥාවෙන් යුතුව හඳුනාගන්නා බැවිනි.

මායාවෙන් ම මුළා වී එයින් ම ජීවනෝපාය ද සාදා ගනිමින් මෙලොව ද දුක්විඳ, පරලොව ද දුගතිගාමීව සතර අපායේ වැටෙන මිනිසුන් අතර මායාව නමැති පාපී කෙලෙසින් දුරුවූවන් ද බොහෝ වෙති. තමන්ට මවුපියන්ගෙන් උරුම වූ දේපළින් ද, තමන් විසින් උපයා සපයා ගත් සාධාරණ ධන සම්පතින් ද, අසීමිත නැණ නුවණින් ද ආඪ්‍ය වූ බෝධිසත්ව ගුණෝපේත උතුමන් ද අපි දැක ඇත්තෙමු. කොතරම් සැප සම්පත් තිබුණේ ද තම සේවකකාරකාදීන්ට යහපත් වචනයෙන් කතා කෙරෙමින්, ඔවුන්ගේ දුක සැප සොයා බලමින්, තමන්ගේ සහෝදරයන්ට මෙන් සලකන මායාවෙන් තොර හාම්පුතුන් මෙලොව සිත සතුටින් ජීවත් වී පිරිසුදු සිතින් නොයෙකුත් පින් දහම් කොට පරලොව දෙව් මිනිස් සැප විඳ කෙළවර නිර්වාණාවබෝධය ලබන්නෝ මෙවන් උතුමෝ ම වන්නා හු ය.

ඒකං ධම්මං අතීතස්ස
මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණපරලෝකස්ස
නත්ථි පාපං අකාරියං

ඇත්ත කීම නම් එකම දහම ඉක්ම වූ, නැතහොත් බොරු කියන, පරලොව ගැන තැකීමක් නැති පුද්ගලයා විසින් නොකොට හැකි පවක් නැත.

ධම්ම පදය... ලෝක වග්ග... 176

සැවැත් නුවර ජේතවනාරාමයේ බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේ පිරිවරා වැඩ වසන කළ රජ මැතිඳුන් සිටුවරුන් සේ ම බොහෝ ජනයා ද සදහම් ආලෝකයෙන් පුබුදු වන්නේ, මිසදිටු බමුණන් කෙරේ ඔවුන් දැක්වූ ගරු සැලකිලි ගිලිහී යන්නට විය. ඔවුන්ගේ පිරිහීම නොවැළැක්විය හැකි තැන නිවටුන් කෙසේ හෝ බුදුගුණ කෙළෙසීමට කටිකා කරගෙන නොයෙක් උපායන් යොදන්නට විය.

අවසානයේ දී චිංචිමානවිකාව නම් අතිශයින් රූප සම්පන්න වූ විලිබිය නැති පරිබ්‍රාජිකාව ඒ සඳහා පොළඹවා ගැන්මට සමර්ථ විය. නිවටුන්ගේ උපායෙහි බැඳුණු ඈ බැතිමතුන් යන එන වේලාවන් බලා දෙව්රම ඔබ මොබ සැරිසරන්නී, බුදුරජාණන් වහන්සේ සමඟ කුළුපග බව අඟවමිනි.

ටික කලක් මෙසේ ගෙවී යද්දී චිංචිමානවිකාව දරමිටි කුස බැඳගෙන ගැබිනි වෙස් ගෙන දම් සභාවට වැද, බුදුරදුන් අභිමුව හිඳ, "ඔබ දම් දෙසමින් සිටින්නේ ය, ඔබ නිසා මා කුස හොත් දරු ගැබ පිළිබඳ නොසලකන්නේ ය"

ආදී වශයෙන් බොරු පවසද්දී සක් දෙවිඳුගේ පඬු ඇඹුල් අස්න උණුවීය. ශක්‍ර දෙවියන්ගේ අණ මත මී වෙස් ගෙන පැමිණි දෙව්වරුන් සතර නමක් දම් සභා මැදම දර බැඳි ලණු එකවිට ම කපා දමද්දී සැදැහැවතුන් විසින් ඒ පිරිවැජියා විහාරයෙන් නෙරපා දැමීමත් සමඟම මහ පොළොව පළාගෙන ගිනිදැල් නැඟෙමින් අවිචිමහා නරකාදියට වැටිණි. ඒ මාතෘකා කොට ගනිමින් තථාගතයන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කොට වදාළ සේක.

බෝපැත්ත, ගැටහැත්ත
ශ්‍රී සෝමානන්ද ඉංග්‍රීසි මාධ්‍ය මූලික පිරිවෙනේ
**රාස්සගල චන්දකිත්ති හිමි**

# නුවණැත්තෝ උඩඟු නොවෙති

**පෙර දවස බරණැස් නුවර දිසාපාමොක් ඇදුරු ආශ්‍රිතව පන්සියයක් මානවකයෝ ත්‍රිවේදය හදරති. ඔවුහු අතිදක්ෂ ය. ශිල්ප දරා ගනිමින් උගනිති. ඇදුරාණෝ ද ආචාර්ය මුෂ්ටියක් නොකොට ම කළෙයෙහි ඉතිරි ජලය වගුරන්නාක් මෙන් උගන්වීය. අවසනායේ ඒ මානවකයන්ට මෙසේ කීහ.**

දිට්ඨ ධම්ම පරම්පරාය වූ මේ ශාස්ත්‍රය මෙ පමණකි. එවිට ඒ මානවකයෝ ඇදුරාණෝ යමක් දනිත් ද, අපිදු එය දැනුම්හ. අපිත් දැන් ආචාර්යයෝ ම යැයි මාන්නය උපද්දවා ගත්හ. එතැන් පටන් ආචාර්යවරයාට ගෞරව රහිත වූහ. වතාවත්වලින් ද වැළකී විසූහ. ආචාර්යතුමාට ඒ බැව් දැනුණි. මොවුන්ගේ මාන්නය බිඳින්නෙමි යැයි සිතුවේ ය. දිනක් ඔවුන් රැස් කරවා පැනයක් විමසී ය.

"දරුවනි, කාලය (පෙරබත් පසුබත්) සියලුම සත්ත්වයන් සමඟින් තමා ද කා දමයි. මත්තෙහි (ප්‍රතිසන්ධිය) ක්ෂය කළා වූ යම් ක්ෂණාශ්‍රවයකු වේ ද, ඒ ක්ෂීණාශ්‍රව තෙමේ සත්ත්වයන් සතර අපායට පත්කරන්නා වූ යම් තෘෂ්ණාවක් වේ ද එය ඥාන නමැති ගින්නෙන් දවාලී ය."

දරුවනි, ඔබ මේ ප්‍රශ්නය විසඳවයි කීහ. ඔවුහු මෙය නොදන්නේ තුෂ්ණීම්භූත වූහ. මෙය තේරුම් ගත් ඇදුරුතුමා "දරුවනි, කම් නැත, අද යන්න. හෙට කියන්න ය'යි ඔවුන් පිටත්කර හැරීය. එසේ ගිය ඔවුන් දස දෙනා, විසි දෙනා සේ රැස්ව සාකච්ඡා කරන්නේ, ප්‍රශ්නයේ මුල ද නොතේරේ. ප්‍රශ්නයේ අග ද නොතේරේ. එහෙයින් නැවත පෙරළා ගොස් ආචාර්යතුමාගෙන් ප්‍රශ්නයේ අර්ථය පවා නොදන්නෙමු යැයි දැන්වූහ. මෙහිදී ආචාර්යතුමා ඔවුනගේ මාන්නය බිඳ හෙළ ීමට නිග්‍රහ කරමින් මෙසේ කීය.

"බොහෝ මනුෂ්‍යයන්ගේ ඔලු ගෙඩි දක්නට ලැබේ. (බෙල්ලෙන් උඩ) රෝම, කෙස් සහිතව, මහත් විශාලව තල් ගෙඩි මෙන් එය පිහිටා ඇත. එහෙත් එහි ප්‍රඥාව ඇත්තේ කිසිවකුට පමණි."

මෙබස් ඇසූ මානවකයෝ ලජ්ජාවූහ. නැමූ කඳ ඇත්තේ වූහ. බිම බැලූ මුහුණු ඇත්තේ වූහ. පාඟිල්ලෙන් බිම ඉරි අඳිමින් තුෂ්ණීම්භූත වූහ. මෙහි දී ඔවුන්ගේ ලජ්ජා සහිත බව දුටු ඇදුරාණෝ "දරුවනි, ප්‍රශ්නය උගනිවු" යැයි කියා ප්‍රශ්නය විසඳී ය.

"කාලය යනු දිවා (පෙරබත්) රාත්‍රිය (පසුබත්) දෙකයි. දිවා රාත්‍රී දෙක්හි ගෙවී යන මේ කාලය විසින් සත්ත්වයන්ගේ මස් ද නොකයි. සම් ද නොකයි. ඇට ද නොකයි. එසේ වී නමුත් ඔවුන්ගේ ආයුෂ ද වර්ණය ද, බලය ද ක්ෂය කරමින් යොවුන් බව නසමින්, නිරෝගී බව ද කාදමයි. මෙහිදී කිසිවකු නොහරියි. සියල්ලෝ ම කයි. තමා ද සමඟ කයි. මත්තෙහි ප්‍රතිසන්ධිය ක්ෂය කළෝ ක්ෂීණාශ්‍රවයෝ ය. ඒ ක්ෂීණාශ්‍රව උතුමෝ යම් මේ තණ්හාවක් සත්ත්වයන් අපායේ හෙළයි ද (ප්‍රතිසන්ධිය ගෙනදෙයි ද) ඒ තණ්හාව, ප්‍රඥා නමැති ගින්නෙන් දවා අළු කළේ යි" යනුයි.

මෙහිදී ඒ මානවකයෝ රාත්‍රියෙහි වූ අඳුර පහන් දහසක ආලෝකයෙන් දුරුවී යන්නා සේ ආචාර්යන්ගේ ඒ විසඳීමෙන් ප්‍රශ්නයාගේ අර්ථය ප්‍රකටව දැන ගත්හ.

අපි දිවි ඇතිතෙක් ගුරුවාසයෙහි වසන්නෙමු ය. මේ ආචාර්යයෝ නම් මහත් ප්‍රඥා ඇත්තේ ය. යම් හෙයකින් අපි බහුශ්‍රැත යැයි යන මානය උපදවා ගෙන සිටිමුත් සිවුපද ගාථාවක ද අර්ථය නොදැන සිටියෙමු. එහෙයින් මාන්නය දුරල වූ ඔවුහු පෙර මෙන් ම ආචාර්යයන්ට වත් පිළිවෙත් කොට මිය පරලොව ගියහ.

මූලපරියාය ජාතක කතාව ඇසුරිනි.

ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ ලේකම්
( බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**



# මසැසින් නොදකින දානයෙහි අනුසස් මනසින් දකිමු

**දානය කියන වචනයේ ඇති වටිනාකම බුදු කෙනෙකුටම හැර සාමාන්‍ය කෙනකුට පැහැදිලි කිරීමට අපහසු ය. පුහුදුන් සත්වයාට ඇති දැනුම් මට්ටම අනුව එම වචනය විග්‍රහ කර දීමට අපහසු ය. එය බුදු ඇසකට ම මිස සාමාන්‍ය ඇසකට නොපෙනේ. මසැසින් දැකිය නොහැකි දානානිසංසය තියුණු මනසින් ම දැකිය යුතු ය. දානය හා එහි අනුසස් බුදුරදුන් මනාව දේශනා කළහ.**

දානය යනු උතුම් ක්‍රියාදාමයකි. එය නිවැරැදි ලෙස සිදු කිරීම තුළින් නිර්වාණය දක්වා ම ගමන් කළ හැකි ය. එසේ වුව ද අද සමාජය තුළ සිදු වන දානමය ක්‍රියා තුළින් නිර්වාණය තබා ලෞකික සැපතවත් ලබා ගැනීම අවිශ්වාස සහගත ය. එයට හේතුව බොහෝදෙනෙක් අද දන්දීම සිදු කරන්නේ තව කෙනෙක් කියනවාට, තව කෙනෙක් කරනවාට, මිය ගිය අය කෙරෙහි බිය නිසා. සමාජයෙන් එන අපවාදවලින් ගැලවීමට, ආදී පටු පරමාර්ථ අරමුණු කොටගෙන වීමයි.

අපට අතින් අත යමක් අනුනට දීම එතරම් අපහසු නැත. එය සාමාන්‍ය දෙයකි. එහෙත් මනසින් චිත්ත තරංග යොමු කිරීම ඉතා අපහසු කාර්යයකි. එසේ වුව ද ඒ සඳහා මනස යොමුකොට පිරිසුදු සිතින් දන් දීම එහි ඇති වටිනාම ක්‍රියාදාමයයි.

මනෝ පුබ්බංගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝමයා

ධම්ම පදයෙහි යමක වග්ගය තුළ සඳහන් මුල්ම ගාථා යුගලය තුළින් සඳහන් වන්නේ සෑම ක්‍රියාදාමයකට ම මනස සම්බන්ධ වන බවයි. එබැවින් අපට මනස අමතක කොට ශරීරයෙහි ක්‍රියාදාමයක් ලෙස සිතා දන්දීම සිදුකළ නොහැක. මනසින් තොර කිසි දෙයක් කළ නොහැකි ය.

"චිත්තේ නීයතී ලෝකෝ" යනුවෙන් සිත මත මුළු ලෝකයම පවතින බව දේශනා කොට ඇත. ඒ අනුව "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි" චේතනාව ම කර්මය වේ යනුවෙන් ඒ බව වඩාත් පැහැදිලි කොට ඇත. එසේ නම් දානයක් දීමේ දී එහි නියම ප්‍රතිඵලය ලබා ගැනීමට අප කළ යුත්තේ කුමක්ද? අප කළ යුත්තේ මනස පිරිසුදු කොටගෙන, තුන් සිත පහදවාගෙන දානමය ක්‍රියාවලියට සම්බන්ධ වීම ය. එහිදී අප ඉස්මතු කර ගත යුතු හා යටපත් කර ගත යුතු සිතිවිලි සමුදායක් ද ඇත.

ප්‍රධාන වශයෙන් අප කළ යුත්තේ මනස තුළ පවතින අකුසල මූල වූ ලෝභ, දෝෂ, මෝහ යටපත් කර ගැනීම ය. අප දානයක් දීමේ දී දානය අතින් පූජා කිරීමක් සිද්ධ කළ ද අපට නොපෙනෙන මනස තුළ අත්හැරීම සිදු වනවා ද යන්න සැක සහිත ය. එයට හේතුව එය අපහසු කාර්යයක් බැවිනි. එම නිසාම බුදුරජාණන් වහන්සේ දන්දීම පිළිබඳ හඳුන්වා දීමේ දී පෙන්වා වදාළේ "දානං ච යුද්ධං ච සමානමාහු" දන්දීම යුද්ධ කිරීමක් හා සමාන බවයි.

අප බහුල වශයෙන් යුද්ධ කරන්නේ අතින් පයින් අවි ආයුධවලිනි. එය ද අමාරු කාර්යයකි. ඊටත් වඩා සිය දහස් ගුණයකින් අමාරු කාර්යයක් වන්නේ මනසත් සමඟ යුද්ධ කිරීම ය. එය සිදු වන අවස්ථාවක් ලෙස දන් දෙන අවස්ථාව හැඳින්වීමට පුළුවන.

දන් දීමේ දී යුද්ධයක් සිදු වන්නේ මනසේ පවතින අකුසල සිතිවිලිත් සමඟ ය. ලෝභය යනු ප්‍රධාන අකුසලයයි. එය නැති කිරීම යනු සසර කතරින් මිදීමට පවා මඟ වන්නේ ය. නමුදු පුහුදුන් වැසියා සසරට බොහෝසෙයින් ඇදී බැඳී සිටින හෙයින් එක ආත්මයක දී හෝ ආත්ම ගණනක දී හෝ එය නැති කිරීම අපහසු කාර්යයකි.

අප කළ යුතුව ඇත්තේ දන් දීමේ දී තදංග (තාවකාලික) වශයෙන් හෝ එය යටපත් කරගෙන දන් දීමයි. එම අකුසල මූලය තමන් දෙන වස්තුව කෙරෙහි සෘජුව ම සම්බන්ධ වනු ඇත. තව කෙනකුට යමක් පරිත්‍යාග කිරීම ශරීරික වශයෙන් කළ ද මනසෙන් සිදු කිරීම ඉතා අපහසු ය. තමා දෙන වස්තුව කෙරෙහි කිසිදු ලෝභකමක් නොමැතිව පිරිසුදු චේතනාවෙන් දන්දීම කළ යුතුව ඇත.

බුදුරජාණන් වහන්සේ තරම් නිර්ලෝභීව දන් දුන් උත්තමයෙක් මේ තුන් ලෝකයේ ම තවත් නොමැත. උන්වහන්සේ සාමාන්‍ය ලෙස නොව අසාමාන්‍ය ලෙස තව කෙනකුට කරන්නට තබා සිතා ගන්නටවත් බැරි විලසින් දන්දීම සිදුකර ඇත.

**සෝ සාගරේ ජලධිකං රුධිරං අදාසි**
**භූමිං පරාජිය සමං ස මදාසි දානං**
**මේරුප්ප මාන මදිකං ච සමෝලි සීසං**
**කේතාරකා දික තරං නයනං අදාසි**

මහා සාගරයේ ජලය පරදවා ලේ දන් දීම, මහ පොළොවේ පස් පරදවා මාංශ දන් දීම, මහා මේරුව පරදවා හිස් දන්දීම, අහසේ තරු පරදවා ඇස් ආදී ශාරීරික කොටස් පවා අසීමිත ලෙස දන් දීම ඒ ඒ භවවලදී බෝසතාණන් වහන්සේ සිදුකළ උතුම් ක්‍රියාවලියකි.

උන්වහන්සේ වෙස්සන්තර ආත්මභාවය තුළ අඹු දරුවන් පවා දන් දුන්හ. සමහර ආත්මවල ජීවිතය පවා දන් දී ඇත. එය සිදු කරන ලද්දේ කාටවත් පෙනෙන්නට හෝ කාගෙන්වත් කීර්ති, ප්‍රශංසා ලබන්නට හෝ එසේ නැත්නම් බියකට හෝ ආපසු ප්‍රතිලාභ අපේක්ෂාවෙන් හෝ නොව, පරම පවිත්‍ර චේතනාවෙන් ලෝක සත්වයා සසර කතරින් මුදවා ගනු වස් බුද්ධත්වය උදෙසා ම ය.

උන්වහන්සේ දන්දීම පාරමිතාවක් වශයෙන් බුද්ධත්වය දක්වා ම පිරිසුදු සිතින් කළහ. එහි අවසාන පරමාර්ථය වූයේ බුද්ධත්වය ලබා ගැනීමයි. ඒ අපේක්ෂාව ඇතිවම පාරමිතා සම්පූර්ණ කොට බුද්ධත්වය සාක්ෂාත් කර ගත්හ. බුද්ධත්වය ලබා ගැනීමට පෙර ආත්මවල උන්වහන්සේට ලෞකික සැප සම්පත් ලැබීමේ වරප්‍රසාද අසීමිත ලෙස තිබුණ ද උන්වහන්සේ ඒවා තුළ ඇලී ගැලී නොසිට දන්දීම බුද්ධත්වය උදෙසාම සිදු කළහ.

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ දන්දීමේ ප්‍රතිඵලය කෙනකු මා තරම් දන්නේ නම් කෑමට ගත් ආහාර පිඟානෙන් බත් පිඩක්වත් සතකුට හෝ නොදී ආහාරයට නොගන්නා බවයි.

එතුළින් ද දානයේ තිබෙන වටිනාකම හා උන් වහන්සේ දානයට ලබා දී ඇති ස්ථානය පිළිබඳ අවබෝධ කර ගැනීමට පුළුවන. දස පාරමිතා, දස පුණ්‍ය ක්‍රියා, සතර සංග්‍රහ වස්තු, ත්‍රිපුණ්‍ය ක්‍රියා ආදී සෑම ස්ථානයක දී ම දානය යන වචනය මුලට තබා ඇත.

සිල් රකිනවාට වඩා, බණ භාවනා කරනවාට වඩා අමාරුම කාර්යය වන්නේ දන් දීමයි. එය මනසත් සමඟ සම්බන්ධ වී මනසත් සමඟ යුද්ධ කොට අකුසල සිතිවිලි පලවා හැර කළ යුතු වීර ක්‍රියාවකි.

දන් දීමේ දී සිත පිරිසුදු කරගත යුතු දෙවැනි කරුණ වන්නේ දෝෂයයි. එනම් දන් දීමේ දී අපට ඇති වන තරහ ගතියයි. සමහර දෙනෙක් බුදුරජාණන් වහන්සේ කෙරෙහි, ධර්ම රත්නය කෙරෙහි, මහා සංඝ රත්නය කෙරෙහි යන ත්‍රිවිධ රත්නය කෙරෙහි හෝ එක් රත්නයක් කෙරෙහි හෝ ද්වේෂ චේතනාවෙන් පසු වෙමින් දන් දෙනු ඇත. එවිට ද ප්‍රතිඵලය නිෂ්ඵල වන්නේ ය. අපේ සිතේ පවතින මේ ද්වේෂය නම් වූ අකුසල සිතිවිල්ල ද තදංග (තාවකාලික) වශයෙන් යටපත් කර ගත යුතුව ඇත. මෛත්‍රී සහගත චේතනාවෙන් දන් දීම ඉතා වැදගත් වේ. ද්වේෂය නම් වූ අකුසල සිතිවිල්ල යටපත් කරගත් කල්හි ඇති වන්නේ අද්වේෂ යයි. එය කුසල සිතිවිල්ලකි. එවිට ප්‍රතිඵලය සාර්ථක වනු ඇත.

දන් දීමේ දී සිතේ පවතින තෙවැනි අකුසල සිතිවිල්ල වන්නේ මෝහයයි. එය ද දන් දීමට බාධා කරන අකුසල සිතිවිල්ලකි. මෝහය යනු මෝඩකම නොහොත් මුළා වීමයි. සමහර දෙනෙක් දන් දීමේ දී එය නිෂ්ඵල ක්‍රියාවක් සේ දැකීමට හුරු වී සිටිති. බුදුරජාණන් වහන්සේ කියා කෙනෙක් සිටියා ද? දන් දීමේ දී පිනක් ලැබෙනවා ද? අප නැවත උපදිනවා ද? කර්මය විපාක දෙනවා ද? ආදී නොයෙක් මිථ්‍යා මතවල එල්බගෙන දන් දෙන ඇත්තෝ ද සිටිති. ඔවුන් එම දානය දුන්න ද ප්‍රතිඵලයක් නොලැබෙනු ඇත.


බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ ද එවැනි මිථ්‍යා දෘෂ්ටිකයන් සිටියහ. අද වුව ද නැතිවා නොවේ. එබැවින් දානයක් දීමේ දී මෝහය නම් වූ අකුසල සිතිවිල්ල ද තදංග (තාවකාලික) වශයෙන් යටපත් කොට ගෙන අමෝහය නම් වූ කුසල සිතිවිල්ල ඇති කොටගෙන දන් දිය යුතු ය.

එවිට ලැබෙන ප්‍රතිඵලය මහත් ඵල මහානිසංස වනු ඇත.

"තුන් සිත පහදා ගෙන දුන් දානය
උන් ගිය ගිය තැන ලැබෙයි නිධානය"

ඉහත කරුණු හරි හැටි අවබෝධ නොකොටගෙන ආවාට ගියාට දන් දී කොච්චර දන් දුන්නත් කෝ ප්‍රතිඵල නෑනේ කීමට තරම් සමහරු අනුවණ ය. අහස උසට දන් දුන්න ද එහි ආනිසංස මහත්ඵල මහානිසංස වීමට නම් ඉහතින් කී කරුණු හරි හැටි අවබෝධ කොටගෙන ම දන් දිය යුතු ය.

මහව,උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී
**ගලගෙදර රතනවංස හිමි**



බුදු සරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

මැදින් පුර අටවක 2023-02-27

## ජීවිතයට වටිනාකමක් දෙන්න

බෞද්ධ උවසු උවැසියනට දහම් ශ්‍රවණයෙහිලා වන පහසුකම් අන් කවර කලෙකටත් වඩා මෙකල්හි ලැබී තිබේ. ගුවන්විදුලියෙන්, රූපවාහිනියෙන් පමණක් නොව ගම් නියම්ගම් පුරා සෑම වෙහෙර බිමකම පාහේ නිරන්තරයෙන් ධර්ම දේශනාමය පින්කම් සංවිධානය කරනු පෙනේ. එම දහම් ශ්‍රවණයෙහිලා ද බොහෝ පිරිස් එක් රොක්වීම භාග්‍යයකි. එහෙත් ඒ අතරින් ඇසූ දහම් මනාකොට ජීවිතයට ගළපා ගන්නේ නම් අතළොස්සක් බව පෙනෙන්නේ ඔවුනොවුන්ගේ ඇවතුම් පැවතුම් ක්‍රියාත්මක වන ආකාරය අනුව ය.

**යථා පි රුචිරං පුප්ඵං**
**වණ්ණවන්තං සගන්ධකං**
**ඒවං සුභාසිතා වාචා**
**සඵලා හොති සකුබ්බතො**

දහම දැන ඉගෙන, ඒ අනුව හැසිරෙන තැනැත්තාට ඒ දහම මනාකොට හිත සැප සලසන්නේ යැයි ධම්ම පදයේ සඳහන් වේ.

මෙම ගාථා ධර්මයට අනුව පුප්ඵං යනු මල් ය. සමන් - තුවරලා - බෝලිද්ද ආදී වූ මනා වර්ණයෙන්, සටහනින් හා සුගන්ධයෙන් යුතු මල් ය. ඒ මල් පැළඳ සිටින පුද්ගලයාගේ සිරුර ද සුගන්ධවත් වන්නේ ය. ඒ සුගන්ධයෙන් යුතු මල් දම තමන් සතුටට පත් කරන්නේ ය. අනුන් ද සතුටු කරන්නේ ය. එහෙයින් පල සහිත වන්නේ ය.

සුභාසිත වාචා නම්, ශ්‍රී සද්ධර්මයයි. එනම් තථාගතයන් වහන්සේ සියලු ලෝ සතුන් වෙත පතළ මහා කරුණාවෙන් දෙසා වදහළ අමා දහමයි. ඒ දහම සකසා දැන ඉගෙන මනා ලෙස පිළිපදින පුද්ගලයාට පමණක් නොව, ඔහු ඇසුරු කරන සියලු දෙනාට ද සතුට වඩන සැප සලසන්නේ ය. සුවඳ හමන මල් සේ ය.

සඵලාහොති නම් පල සහිත වන බව ය. පල යනු සම්බුදු දහමට අනුව හැසිරී, ලොව්තුරු සැප ලැබීම ය. ඒ අනුව සිත්කලු වූ, පැහැ සටහන් ඇති, සුවඳ සහිත වූ මල යම් සේ සුවඳ පතුරයි ද? එ පරිදි, තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මය මනා ලෙස පිළිපදින්නාට පල සහිත වන්නේ ය.

බෞද්ධයන් වූ අපට තථාගත ශ්‍රී සද්ධර්මය හැර අන් සැපතක් නැත. මෙලොව ජීවිතය පමණක් නොව පරලොව ජීවිතය ද සුව සලසා ගනිමින් මේ ඝෝර සසර මඟ දුකින් මිදී උතුම් නිවන්සුව සලසා ගැනීමේ මාර්ගය ද උන්වහන්සේ අපට පෙන්වා දුන්හ.

බෞද්ධයාගේ ඒකායන අරමුණ විය යුතු ධර්මචාරී වෙමින් ඒ උතුම් නිවනට පිවිසීම ය. එහිදී ගිහියාට අනුදැන වදාළ පංචශීල ප්‍රතිපදාවේ සිට අපට දහම් මාවතට ප්‍රවේශවිය හැකි ය.

පස්පවින් වැළකුණ පුද්ගලයා අනුන්ගේ ප්‍රාණය ආරක්ෂා කරන්නෙක් වේ. අනුන්ගේ දේපළ ආරක්ෂා කරන්නෙක් වේ. විශ්වාසය රකින්නෙක් වේ. බොරුවෙන් අනුන් නොරවටන ඔහු මදයට හෝ ප්‍රමාදයට පත්වන්නෙක් නොවේ. ඒ පුද්ගලයා තමන්ට අර්ථකාරී වෙමින් අනුන්ට ද අර්ථවත් වන්නේ ය.

එතැන් සිට ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක යන අටලෝ දහමින් කම්පා නොවී ජීවිතයට මුහුණ දෙමින් තම දරුවන්ට ද ඒ මඟ යන්නට ආදර්ශය සැලසීම ගිහි බෞද්ධයාගේ යුතුකම ය.

ධම්ම පදය බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථයකි. එහි ගාථා ධර්ම අර්ථවත් ජීවිතයට අපූර්ව ලෙස මඟ පෙන්වයි. පුංචි දරුවාගේ සිට මහල්ලා දක්වා ම ප්‍රයෝජනවත් ය. මේ උතුම් දහම් කරුණු පොතට සීමා නොකර, අසන දහම් පද ඒ අවස්ථාවට පමණක් සීමා නොකොට ජීවිතයට ගළපා ගන්නා පුද්ගලයා දෙලොව ම දිනන පුද්ගලයෙක් වන්නේ ය.

# අම්මට තාත්තට ණය නොවීමට නම් ...



**බ්‍රහ්ම යනු මවට - පියාට නමකි - මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා නම් උතුම් ධර්ම සතරකි. පුද්ගල චරිතය ශ්‍රේෂ්ඨත්වයට පත්කරන ගුණාංග සතරකි. මහා බ්‍රහ්මයා සතු මේ ගුණ නිසාම ඔහු වන්දනීයත්වයට පත්වේ.**

අම්මා - තාත්තා තම දරුවන් කෙරෙහි ද මෙම ධර්ම සතර ම පතරුවති. ඒ නිසා "මවුපියන් ද" මහා බ්‍රහ්ම යන නාමයෙන් හැඳින්වේ.

කුස තුළ වැඩෙන දරුවා දෙනෙතින් දකින්නේ කවදා දැයි සිතමින් මව්පියන් මෛත්‍රී සිතිවිල්ලෙන් බලා සිටී.

බිළිඳා ටිකෙන් ටික වැඩෙමින් සුරතල් බස් දොඩමින් සෙල්ලම් කරන කාලය පැමිණි විට මව - පියා මහත් වූ සතුටුව දරුවා කෙරෙහි මුදිතාව ඇතිකර ගනී. ඒ දරුවා වැඩිවිය පැමිණ පවුලෙන් වෙන් ව වෙසෙන දින, දැන් අපේ දරුවාට ස්වශක්තියෙන් ජීවත්විය හැකි යැයි මව - පියා තුළ තම දරුවා කෙරෙහි මධ්‍යස්ථතාවය වූ උපේක්ෂාව පහළ වේ.

මේ ආකාරයෙන් බ්‍රහ්මයා හා සමාන පැවතුම් ඇති බැවින් මව - පියා දරුවනට බ්‍රහ්මයා වෙති.

පූර්වාචාර්යයන් යනු ද මව - පියාට නමකි -

බාල වියෙහි සිටින දරුවාට යහපත් වූ හෝ අයහපත් වූ කිසිවක් නො දන්නේ ය. දරුවා ටිකෙන් ටික ඉගෙන ගන්නේ පරිසරයෙනි. හොඳ නරක තෝරා බේරා ගන්නේ තමන්ට ලැබෙන අත්දැකීම් අනුව ය. පළමුව මවගෙන් - පියාගෙන් ඒ අත්දැකීම ලැබීමෙන් ය. මවත් - පියාත් තම දරුවා කුඩා කල සිට ම පුතේ - දුවේ ඔබ මේ ආකාරයෙන් සිටිය යුතු ය. මේ ආකාරයෙන් නිදා ගත යුතු ය. මේ ආකාරයෙන් ගමන් - බිමන් යා යුතු ය. මේ ඔබේ පියා ය. මේ ඔබේ අම්මා ය. මේ සොහොයුරා ය. සොහොයුරිය ය. මේ දේ ඔබ කළ යුතු ය. මේ දේ ඔබ නො කළ යුතු ය. ආදී කුල සිරිත් මෙන් ම සදාචාර ගුණ ධර්ම පිළිබඳ උපදෙස් දී තම දරුවන් හික්මවති. එහෙයින් මවත් - පියාත් පූර්වාචාර්යවරු වෙති.

ආහුණෙය්‍යය යනු ද මවට - පියාට නමකි -

තම දරුවා දස මසක් කුස උසුලා මෙලොව බිහි වූ දා සිට දිවා රෑ දෙකෙහි නිදි නො ලබා, පිළිකුල් වූ සෙම් - සොටු, මළ මුත්‍රාදීය පවා කැත යැයි නො සිතා තම දෑතින් ම ඉවත් කිරීමෙන් ද, මවගේ ශරීරයේ ලේ ධාතුව කිරි කොට පෙවීමෙන් ද, අත් පා ආදිය නිසි ලෙස සැකසීමෙන් ද මනා වූ රූප සම්පත්තියකින් යුක්තව ඇති දැඩි කරති. වෙහෙස වී උපයා ගන්නා ධනය දරුවන් උදෙසා ආරක්ෂා කර තැබීම ආදී ලෙසින් මව - පියා දරුවන්ට බොහෝ උපකාර කරති. මව - පියා ඉත සිතින් දරුවනට අනුකම්පා කරන බැවින් ප්‍රජානුකම්පකයෝ වෙති. අම්මා තාත්තා නැසීමට උත්සාහ කරන කුරිරු දරුවන්ට පවා ඔවුහු අභිවෘද්ධියම සලසති. මෙයට හොඳම නිදසුන වන්නේ බිම්බිසාර රජතුමාගේ චරිතයයි. "අජාසත්" නම් තම පුතු මව් කුස සිටිය දී සිය උරයෙහි ලේ බිමට බිසවට ඇති වූ දොළ සංසිඳවීය. මේ දොළ පිළිබඳ නිමිති පවසන්නෝ මෙසේ පැවසීය. එනම් යම් දිනක මේ උපදින කුමරු බිම්බිසාර රජු මරා මේ නුවර රජ වෙන බව ය. ඉපදීමට ද පෙර තමාට එරෙහි වූ හෙයින් අජාසත් යැයි නම් කළේ ය.

බිම්බිසාර රජු කෙරෙහි මහත් වූ භක්තිවන්ත වූ බිසව සිය කුස හොත් දරුවා නැසීමට පවා තැත් කළා ය. එය ඇසූ රජතුමා කිපී තම පුතු රැකීමට රැකවල් ද තැබීය. අජාසත් කුමරු කුඩා අවධියේ අතේ ඇඟිල්ලක ගෙඩියක් සෑදී මහත් වේදනාවෙන් හඬන්නට විය. ඒ අවස්ථාවේ දී කුඩා කුමරු වඩාගෙන, වේදනාව සමනය කිරීමේ අදහසින් කුමරුගේ ඇඟිල්ල සිය මුව තුළට ගෙන උරමින් සිටි අවස්ථාවේ දී ගෙඩිය පිපිරී රජතුමාගේ මුව තුළට සැරව ගලා ආවේ ය. ඇඟිල්ල මුවෙන් ඉවතට ගත් විට කුමරුට වේදනා ඇතිවේ යැයි සිතා සැරව ද තමන් ම ගිල ගත්තේ ය.

කුමරු වැඩිවිය පැමිණ තමා නසා රජවීමට තැත් කළ විට ද පුතුට අනුකම්පා කොට සිය රාජ්‍යය ද පුතුට පැවරීය. එහෙත් පුතුගෙන් ම මරණයට පත් විය. බිම්බිසාර රජතුමා තම පුතුගෙන් ම යම් දිනෙක ගැහැට ලැබ මරණයට ද පත්වන බව දැන දැන ම පුතුට අනුකම්පා කොට පුතුගේ ම අභිවෘද්ධිය සැලසී ය. මව්පියන් දරුවන්ට මොන තරම් අනුකම්පා කරන්නේ ද යන්නට මේ සා ප්‍රබල උදාහරණයක් වේ යැයි සිතිය නොහැකි තරම් ය.

මේ ආකාරයෙන් මව්පියන් අනන්ත ගුණ ඇති බැවින් නුවණැති දරුවෝ ඒ මවට - පියාට නමස්කාර කළ යුතු ය. ආහාරයෙන් ද, පානයෙන් ද, සයනයෙන් ද, ඇඟ ඉලීමෙන් ද, නෑවීමෙන් ද, පා සෝදා දීමෙන් ද, සත්කාර කළ යුත්තේ ය. මවත් - පියාත් සේ දරුවනට උපකාර කළා වූ කිසිවකු මෙලොව නැත්තේ ය. එබැවින් ජීවත්වන සෑම දරුවෝ ම තම මවට - පියාට ණය ගැතියෝ වෙති. ඒ ණයෙන් නිදහස්වීම අප සිතන තරම් පහසු නැත්තේ ය.

එබැවින් මවට - පියාට උපස්ථාන කරන සත්පුරුෂ දරුවෝ ආහාර පානාදියෙන් පමණක් උපස්ථාන කිරීමෙන් නො නැවතිය යුතු ය. මව්පියන් ශ්‍රද්ධාන්ත නො වේ නම් ඔවුන් ශ්‍රද්ධා සම්පත්තියෙහි පිහිටුවීමට උත්සාහ ගත යුතු ය. දුශ්ශීල වූ මව්පියන් ශීල සම්පත්තියෙහි පිහිටුවන්ට වෙර වැඩිය යුතු ය. ඒ වගේ ම මසුරු වූ මව්පියන් ත්‍යාග සම්පත්තියෙහි මෙන් ම ප්‍රඥා සම්පත්තියෙහි ද පිහිටුවන්නට උත්සාහ කළ යුතු ය. එවිට මවට - පියාට සෑහෙන පමණකට හෝ ප්‍රත්‍යුපකාර කරන ලද්දේ වන්නේ ය.

**දීපා පෙරේරා**



# ඉවසන හැටි ඉගෙන ගන්න
# රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතය කියවන්න

**අරුණලු නැඟෙන්නට පළමුව අවදි වූ රාහුල පොඩි හාමුදුරුවෝ බුදුපියාණන්ට හා සැරියුත් හාමුදුරුවන්ට මුව දෙවීමට පැන් පෙරා තැබූහ. අනතුරුව මළුපෙත්මං ඇමඳ මුසුන් හලේ ඉදල තබා මුව දෙවන්නට පොකුණ අසලට ගියහ.**

උන්වහන්සේ කෝපයට පත් කරන්නට සිතූ සද්ධිවිහාරික කුඩා සාමණේර හිමිනමක් නැවත ඒ ඉදල රැගෙන මළුව මැද දමා

"මෙන්න, රාහුල මළුව ඇමදලා ඉදල මුසුන්හලේ තියලා නෑ" යි

කියමින් කෑ ගැසුවේ ය. එවිට අවට සිටි අනෙක් සාමණේර හිමිවරුන්ගේ සිනා හඬ පැතිරුණි. රාහුල පොඩි හාමුදුරුවෝ සිනාවක් පා යළිත් ඉදල රැගෙන මුසුන්හල වෙතට ගියහ.

මේ අතර තවත් සාමණේර නමක් මළුවේ තැනින් තැනට කොළරොඩු ගෙනවුත් දමා "රාහුල හරියට මළුව අතුගාලා නෑ" කියා හඬ නැඟුවේ ය. උන්වහන්සේ යළිත් මිදුල ඇමදියහ. සද්ධිවිහාරික සාමණේරවරුන් අමනාපයකට නොව විනෝදයට කරන මෙබඳු විහිලුවලින් පොඩි හාමුදුරුවෝ කිසිදාක කෝප නොවූහ.

සැරියුත් හාමුදුරුවන්ගේ පවුලේ සියල්ලන් ම පැවිදිව රහත් බව ලබා සිටියත්, මෑණියෝ තුණුරුවන් කෙරෙහි සැදැහැ නැති තැනැත්තියකි. අසූ කෝටියක් පමණ වූ පාරම්පරික ධනයක් හිමිව සිටි ඕ, දරුවන් පැවිදි වූ නිසා තමාගෙන් පසු ඒ සියලු ධනය විනාශ වේ යැයි සිතුවා ය. එබැවින් ඇගේ සිතේ භික්ෂූන් කෙරෙහි තදබල අමනාපයක් විය.

මෑණියන් තෙරුවන් කෙරෙහි පහදවා ඇයට නිවන් සුවය ලබා දීමට සැරියුත් හාමුදුරුවන් දැරුවේ බලවත් වෙහෙසකි. සැදැහැ සිතක් නැතත් ඇයගේ නිවෙසට පිඬු පිණිස වඩින්නට උන්වහන්සේ සිතුවේ එබැවිනි. එහි යාමට එන ලෙස උන්වහන්සේ රාහුල පොඩි හාමුදුරුවන්ට කීහ.

සැරියුත් හාමුදුරුවන්ගේ මෑණියන්ගේ සිත තුළ දරු සෙනෙහසේ අඩුවක් නැත. එම නිසා පුතු දුටු කෙණෙහි ම ගෙයින් එළියට ආ ඇය පිණ්ඩපාතය බෙදන්නට වූවා ය. ඇගේ බලවත් අමනාපය පුතා පැවිදිවීම ගැන ය.

"ගෙදර මෙච්චර කන්නට බොන්නට දේවල් තියෙද්දී ඒ ඔක්කොම දමලා ගිහින් මටත් නින්දා කර කර ඉඳුල් කකා ඇවිදිනවා. අදවත් ඉතින් බඩ පිරෙන්න කන එකයි ඇත්තේ. මේ මගේ අතින් ම හැදූ කෑම. බොහොම රසයි."

කියමින් ඕ තම පුතුගේ පාත්තරය පිරෙන්නට දානය බෙදුවා ය. සෙසු පැවිද්දන්ට දානය පිළිගන්වන විට ඇයගේ සිතේ තිබූ අමනාපය වැඩි විය.

"නුඹලා තමයි මගේ දරුවන්ටත් සිඟා කන්න පුරුදු කළේ. මගේ දරුවන් මහණ කරලා මගේ මුළු වස්තුව ම විනාශ වෙන්න කටයුතු යෙදුවා," යැයි ඇය බැන්නා ය.

වැඩිහිටි පිළිවෙළින් වඩින සඟ පිරිස අතර ඊළඟට හිටියේ රාහුල පොඩි හාමුදුරුවන් ය. ඇය උන්වහන්සේ දුටු කෙණෙහි ම හඳුනා ගති.

"රජ මාළිගාවේ අර තරම් කෑම බීම තියෙද්දී ඒවා ඔක්කොම දමලා ඇවිත් දැන් ඉතින් අඟුපිල්වලට ගිහින් කන්න හොයනවා. මේ පූරුවේ කරපු පව් තමා. ජේනව ද හිඟා කන වළං කබලේ ලස්සන? මං දන්නවා පුංචිවට හිටියට නුඹ තමයි මගේ පුතා රවට්ටලා වැඩ ගන්නේ. මේ කෑමත් රජ මාළිගාවේ කෑමට දෙවෙනි නෑ. කාලා බඩ පුරවා ගන්නවා."

රාහුල පොඩි හාමුදුරුවෝ ඇයගේ වදන් නෑසුනා සේ නිහඬව සිට දානය පාත්තරයත් රැගෙන ආරාමය වෙත පැමිණියහ. උන්වහන්සේ දානය වැළඳීමට පෙර සුපුරුදු පරිදි පිණ්ඩපාතයෙන් කොටසක් ගෙන ගොස් බුදුපියාණන්ට පිළිගැන්වූහ.

"රාහුල, අද කොහාට ද පිණ්ඩපාතේ ගියේ?"

"පියාණනි, මගේ මිත්තනිය දිහාවට යි ගියේ. මගේ ගුරු පියාණන්ගේ අම්මගේ ගෙදරට."

"ඇය භික්ෂූන්ට බොහොම අකැමැති යි නේ. මහා බ්‍රහ්මයාට නේ වැඳුම් පිදුම් කරන්නේ. ඉතින් ඇය දානය කැමැත්තෙන් පිළිගැන්නුව ද?"

"නෑ, පිණ්ඩපාතේ වැඩිය හාමුදුරුවරුන්ට බැණ බැණ තමයි උන්දෑ දානේ බෙදුවේ."

"රාහුලටත් බැන්න ද?"

"එහෙමයි. මටත් උන්දෑ නොයෙක් ඇනුම් පද කීවා."

"ඉතින් රාහුලගේ සිතේ ඒ වෙලාවේ තරහක් ඇති වුණා ද? බැණ බැණ දෙන කෑම මට මොකට ද කියලා දානේ විසි කරලා එන්න හිතුනේ නැද්ද?"

"නෑ. පියාණෙනි, මම එහෙම හිතුවේ නෑ. මට උන්දෑ ගැන තරහක් ඇතිවුණෙත් නෑ. මගේ ඇඟේ වදිනවා යැ. උන්දෑට ඕනෑ දෙයක් කියාපුවාවේ කියලා කරබාගෙන හිටියා. මට පිණ්ඩපාතේ බෙදුවට පස්සේ පාත්තරෙත් අරගෙන මම ආපහු ආවා."

"ඔබේ ඉවසීම ඉතා හොඳයි. රාහුල, කිසිම දෙයකින් කෝපයට පත් නොවන, ඉවසීම හුරු කළ තැනැත්තා බොහොම උසස් කෙනෙක්."

අරුණ නැඟෙන්නට පළමුව වතාවත් නිම වූ රාහුල පොඩි හාමුදුරුවෝ මළුවේ සේපාලිකා මල් ගස යටට ගොස් සුදුවැලි දෝතක් රැගෙන උඩ විසි කරන්නට වූහ. ගන්ධකුටියේ කවුළුව විවර කර මළුව දෙස බැලූ බුදුපියාණන්ට දෝතෙන් වැලි උඩ දමමින් සෙල්ලම් කරන පුතු දක්නට ලැබුණි.

පුතා බොහොම ලස්සන යි. රාජ සුකුමාල යි. ඔහුට තිබෙන්නේ රජකුට ගැළපෙන තේජවන්ත පෙනුමක්. තමන් ශාක්‍ය රජ පවුලේ කෙනකු නිසා ඇතැම්විට ඔහු රූපය, ජාතිය හා කුලය ගැන සිතා අහංකාරකමක්, මාන්නයක් හිතේ ඇතිකර ගන්නට පුළුවනි. එහෙම වුවොත්, ඔහුගේ ජීවිතයට එය ඉතා නරකයි. ජීවිතයේ දියුණුවට බාධාවක්. පුතු දෙස බලමින් මෙසේ සිතූ බුදු හාමුදුරුවෝ "රාහුල, මෙහෙ එන්නැ"යි පොඩි හාමුදුරුවන්ට කතා කළහ.

"එනවා. පියාණනි." කියමින් උන්වහන්සේ වහා බුදුකුටියට පැමිණියහ.

"රාහුල වැලි උඩ දමමින් මළුවේ සෙල්ලම් කරනවා වගේ මම දුටුවා."

"එහෙමයි. ඒ උඩ දැමුව වැලි කැට ගණනට මට මගේ පියාණන්ගෙනු යි, ගුරු පියාණන්ගෙනු යි අද අවවාද ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කළා."

දෙමවුපියන් හා ගුරුවරුන් සමඟ එකට ජීවත්වීම, ඔවුන්ගෙන් නිතර ම අවවාද හා දඬුවම් ලැබීම, නිතර දෙවේලේ ඔවුන් දකින්නට ලැබීම වැනි හේතු නිසා තම ගුරුවරුන්ගේ හා මවුපියන්ගේ අගය කුඩා දරුවන්ට නොදැනෙන්නට පුළුවන්. ඔවුන් කෙරෙහි දැක්විය යුතු ආදරය හා ගෞරවය දරුවන් කෙරෙන් ඈත්වන්නට පුළුවන්. නිවෙසක හිටියත්, අරමක හිටියත් කුඩා දරුවන් තුළ මේ තත්ත්වය ඇති වෙනවා. මගේ පුතාට වුවත් සමහරවිට මෙය බලපෑ හැකි යි. ඒ නිසා ඔහුගේ ගුරු ගෞරවය පිළිබඳ විමසිය යුතු යැයි බුදුහාමුදුරුවෝ සිතූහ.

"රාහුල, ඔබේ ගුරුවර සැරියුත් නුවණින් අගතැන්පත් වූ කෙනෙක්. මෝහය නමැති අඳුරේ ගිලී ඉන්න මිනිසුන්ට එයින් එළියට එන්නට නුවණ නමැති එළිය දෙන පහන දරා සිටින උතුමෙක්. ඔබ නිතර දෙවේලේ එතුමා දකිනවා. අවවාද උපදෙස් ලබනවා. ඔබ ඔබේ ගුරුතුමාට අගෞරවයක් වන විදියට හැසිරෙනව ද? නැතිනම් කිසිම අඩුපාඩුවක් සිදුනොවන ආකාරයට එතුමාට ගරු බුහුමන්, ඇප උපස්ථාන කරනව ද?"

"පියාණනි, ලෝකේ මිනිසුන්ට අඳුරෙන් මිදී එළියට එන්නට නුවණ නමැති එළිය දෙන පහන අල්ලා සිටින මගේ ගුරු පියාණන් කෙරෙහි මා දක්වන ගෞරවයේ කිසිම අඩුවක් නෑ. නිතරම මම උන්වහන්සේට උපස්ථාන කරනවා. ගරුබුහුමන් දක්වනවා" යැයි රාහුල පොඩි හාමුදුරුවන්ගෙන් පිළිතුරු ලැබුණි. තමන් වහන්සේ කෙරෙහි පුතු තුළ පවතින පීතෘ ස්නේහය හා ගෞරවය පිළිබඳ දන්නා බැවින් බුදුහාමුදුරුවන් ඒ ගැන කිසිවක් ඇසුවේ නැත.

"පුතා රාහුල, ඔබ සියලු රජ සැප අත්හැර දමා මා පසුපස ඇවිදින් පැවිදි වුණේ ශ්‍රද්ධාවෙනු යි. ඒ නිසා ඔබ සසර දුක් කෙළවර කර ගන්නට උත්සාහ කරන්න ඕනෑ. ඔබේ දියුණුව සැලසෙන්නට නම්, කල්‍යාණ මිත්‍රයන් ම ආශ්‍රයට තෝරාගත යුතු යි.

"සෙනසුන්වල, මඟ තොටේ කණ්ඩායම් වශයෙන් රැස් වෙලා වැඩකට නැති හිස් බස් දොඩවමින් නිකරුණේ කාලය ගත කරන අයගේ ඇසුරට ඔබ යන්න එපා."

"රාහුල, සිව්පසය කෙරෙහි ගිජුවීම හොඳ නෑ. ආහාරපාන වළඳන කොට ප්‍රමාණයකට වළඳන්න. ඔබ පුංචි දරුවකු නිසා දායකයන් ඔබට ආදරේට වැඩිපුර ආහාර පිළිගන්නාවි. නමුත් ඔබට සෑහෙන තරම විතරක් පිළිගන්න. ආහාර ටිකක් ලැබුණ විට ඒවා මදියි කියා හිතලා දුක් වෙන්නත් එපා. ලද පමණින් සැනසෙන්න."

මේ උපදෙස් ලැබුණ කෙණෙහි ම "පියාණනි, සිව්පසය පිළිබඳ සංවරය ඇතිකර ගන්නට මම අද සිට උත්සාහ කරනවා."යැයි රාහුල පොඩි හාමුදුරුවන් පැවසුවේ දැඩි අධිෂ්ඨානයකිනි.

**ඉතිරිය 08 පිටුවට ...**

අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ
මහා ලේඛකාධිකාරී ආචාර්ය
**මැදගම ධම්මානන්ද නා හිමි**

බුදුසරණ



# කැලණි විහාරය හා සබැඳි දෙවි දේවතාවෝ

**විහාරස්ථාන ආශ්‍රිතව ප්‍රකට හා අප්‍රකට මෙන්ම ප්‍රධාන හා අප්‍රධාන දෙවිවරුන් දක්නට ලැබීම බෞද්ධ ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙන ලක්ෂණයකි. ඓතිහාසික කල්‍යාණි රාජමහා විහාරය හා සබැඳි ශ්‍රී ලාංකික බෞද්ධ දෙවි දේවතාවුන් වහන්සේලා පිළිබඳ කරුණු ස්වල්පයක් සමාලෝචනය කිරීම මෙම ලිපියෙහි අරමුණයි.**

කැලණි විහාරය ප්‍රධාන කැලණිය භූමිය විභීෂණ දෙවියන්ගේ වාසභූමිය බව ප්‍රකට කරුණකි. කැලණි වෙහෙර බිම පිහිටි ඓතිහාසික විභීෂණ දේවාලය එහි කේන්ද්‍රස්ථානය යි. කැලණිය කේන්ද්‍රකොටගෙන සිරිලක සම්බුදු සසුන සුරකින විභීෂණ දෙවියෝ ශ්‍රී ලාංකික බෞද්ධයන්ගේ අතිමහත් ගෞරවයට, අභිවාදනයට හා අභිමානයට පත් විය. එය සංකේතවත් කරමින් කැලණි විහාරයේ වාර්ෂික දුරුතු මහා පූජෝත්සව පෙරහරේ දී විභීෂණ දෙවියන් වෙනුවෙන් ම පෙරහරක් පවත්වා පූජෝපහාර දක්වනු ලැබේ.

සුප්‍රකට රාම - රාවණ සිද්ධියේ දී විභීෂණ කුමරු සිය සොහොයුරාගේ පාර්ශ්වය නොව අගතියට පත් රාම කුමරුගේ පාර්ශ්වය ගෙන ඔහුට උපකාර කිරීමෙන් තමන් තුළ වූ අපක්ෂපාතී, සාධාරණ හා සදාචාරවත් දෘෂ්ටිය ලොවට විදහා පෑවේ ය. එහි සාංදෘෂ්ටික ප්‍රතිඵලයක් ලෙස යුද්ධයෙන් ජය ගත් රාම කුමරුගේ ආශීර්වාදයෙන් විභීෂණ කුමරු ලක්දිව අගරජ ලෙස අභිෂේක කරවනු ලැබිණි. ඉන්පසු විභීෂණ රජ කැලණි පුරය අගනුවර කොට දැහැමෙන් රාජ්‍යය විචාළේ ය. සිරිලක අගරජ ලෙස ද ධාර්මිකව ජන සෙත සැලසූ එතුමෝ කීර්තිභාවශේෂෝපගත වීමෙන් පසු ලක්දිව පමණක් නොව දඹදිව ද දේවත්වයෙන් පුදනු ලැබූහ. එවක් පටන් අද දක්වා කැලණිය කේන්ද්‍රකොටගෙන විභීෂණ දෙවියන් පිදීම සිදු කරනු ලබයි.

විභීෂණ දෙවියන්ට පුද පූජා උපහාර දක්වන විශේෂ හේතු කිහිපයක් ම දැකිය හැකි ය. ඉන් එකක් නම් දරු සම්පත් පැතීමයි.

විභීෂණ දෙවියන්ගේ ආශීර්වාදයෙන් දරු සම්පත් ලැබුවන් අතර රාජරාජ මහා මාත්‍යාදීහු ද වෙති. ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙම කරුණ පිළිබඳ ප්‍රකට ම උදාහරණය කෝට්ටේ සිරි පැරකුම්බා රජුගේ කණිටු දියණිය වූ උලකුඩය දේවිය (විවාහයට පෙර ලෝකනාථා කුමරිය) ගේ දරු උපත යි.

උලකුඩය දේවියට දරු උපතක් ලබාදෙන ලෙස විභීෂණ දෙවියන්ගෙන් ඉල්ලා තොටගමුවේ ශ්‍රී විජයබා පිරිවෙන්පති ෂඩ්භාෂා පරමේෂ්වර තොටගමුවේ සිරි රාහුල හිමියන් සැළලිහිණියකු දූතයා කොට යැවූ සැළලිහිණි සන්දේශය එම ඓතිහාසික සිද්ධියේ සාහිත්‍යාගත සාක්ෂියයි. ඉන් උපන් පුත් කුමරු දෙවන ජයබා ලෙස කෝට්ටේ රජ පදවියට ද පත් විය. මෙසේ දරු සම්පත් පතා විභීෂණ දෙවියන් පිදීම අද දක්වා ම කැලණියේ පවත්නා චාරිත්‍රයකි.

විභීෂණ දෙවියන්ගේ තවත් විශේෂයක් ලෙස සතුරන් සහ බාධක ජය ගැනීමට ආශිර්වාද කිරීම දැක්වේ. සතුරන් බියට පත් කළ බැවින් විභීෂණ නම් වූ බව ද සඳහන් ය. සිය බාධක ජය ගනු වස් විභීෂණ දෙවියන්ට පින්පෙත් දී පිහිට පැතීම අද ද සිදු වෙයි.

කැලණි විහාරයේ ඓතිහාසික විහාර මන්දිරයෙහි පැරැණි විහාරය කොටසෙහි

“විභීෂණ දෙවියන්ගේ තවත් විශේෂයක් ලෙස සතුරන් සහ බාධක ජය ගැනීමට ආශිර්වාද කිරීම දැක්වේ. සතුරන් බියට පත් කළ බැවින් විභීෂණ නම් වූ බව ද සඳහන් ය. සිය බාධක ජය ගනු වස් විභීෂණ දෙවියන්ට පින්පෙත් දී පිහිට පැතීම අද ද සිදු වෙයි.”

ඇතුල් මාලයේ සැතපෙන පිළිමයට දකුණු පසින් දේවාල මන්දිරයක් වෙයි. එහි විෂ්ණු කතරගම (නම සඳහන් වන්නේ කන්දසාමි ලෙසිනි) සහ සිරි සුමන සමන් දෙවියන් වෙනුවෙන් වන දේවාලයකි. එම මූර්තිමත් දේව ප්‍රතිමා නුවර යුගයේ නිර්මාණ ලක්ෂණ විදහා දක්වයි. ඉන් ඉදිරිපස බිත්තියෙහි ඇතුළු මාලයේ දකුණු පස දොරටුවේ වම් පස ගණ දෙවියන් සහ ඊශ්වර දෙවියන් චිත්‍රණය කොට ඇත. දොරටුවට දකුණු පසින් ගන්ධර්වාධිපති ධෘතරාෂ්ට්‍ර දෙවි, නාගාධිපති විරූඪ දෙවි, කුම්භණ්ඩාධිපති විරූපාක්ෂ දෙවි, යක්ෂාධිපති විරූපාක්ෂ දෙවි යන සතර වරම් දෙවි මහරජ දරුවන් චිත්‍රණය කොට ඇත. දකුණු පස දොරටුවට දකුණු පසින් සමන් දෙවියන් සහ විභීෂණ දෙවියන් චිත්‍රණය කොට ඇත. මෙම චිත්‍ර සියල්ලක් ම ද නුවර යුගයේ බිතුසිතුවම් ලක්ෂණ මැනවින් ප්‍රකට කරයි.

තුනුරුවන් සරණ ගිය පින් කැමති ශාසනාරක්ෂක හා ශාසනමාමක දෙවි දේවතාවන් මෙන් ම හින්දු දේව සම්ප්‍රදායට අයත් දෙවිවරු ද මෙසේ චිත්‍රණය කොට ඇති බව පෙනේ. ඉහත සඳහන් කළ විභීෂණ දේවාලයේ ප්‍රධාන දොරටුව දකුණු පසින් ගම්භාර දෙවියන් සඳහා වූ දේව මන්දිරයක් වෙයි.

නැවත අභිනව විහාර මන්දිරයේ පිටත බිත්තියෙහි විෂ්ණු, කතරගම, සුමන සමන් දේව ප්‍රතිමා මූර්තිමත් කොට තිබේ. ඒ අතර ඇති විභීෂණ අභිෂේකය ශ්‍රී ලංකාවේ විහාර චිත්‍ර මූර්ති අතර දක්නට ලැබෙන දුර්ලභ මූර්තියකි. එහිම ඇති නාථ දෙවියන් ලෙස ද දැක්වෙන මෛත්‍රී බෝධිසත්ත්ව ප්‍රතිමාව ද සුවිශේෂ ය.

රවි දේවතාවන් ප්‍රධාන නවග්‍රහ දේව ප්‍රතිමා සහිත නවග්‍රහ දේව මන්දිරය ද ලක්දිව නන් දෙසින් නිතිපතා ආශිර්වාද පතා පැමිණෙන කැලණි විහාරයේ නවාංගයකි.

සබරගමු බස්නාහිර ප්‍රදේශවලට සුවිශේෂ රන්වල දෙවියන් නිරන්තරයෙන් කැලණි වෙහෙර වන්දනාවෙහි යෙදෙන බව පිළිගැනේ. කැලණි ගඟ සිය ගමන්මඟ කොටගෙන මෙම රන්වල දෙවියන් නිතර කැලණි වෙහෙර වැඳීමට පැමිණීම පිළිබඳ තොරතුරු හා කතන්දර මෙපෙදෙස් ආශ්‍රිත වැසියන් අතර ජනප්‍රිය ය. රන්වල දෙවියන් වෙනුවෙන් උපහාර පූජා පැවැත්වීම ද කැලණි ගඟ ආශ්‍රයෙහි වෙසෙන ජනී ජනයාට ආවේණික සංස්කෘතිකාංගයකි.

ආසියානු බෞද්ධ හා අනෙකුත් සම්ප්‍රදායයන්හි නාගයන් සලකනු ලබන්නේ භූම්‍යස්ථ දේව කොට්ඨාසයක් ලෙසිනි. ජලාශ්‍රිත පුදබිම්වල නාගයෝ (නාග දෙවිවරු) විශේෂයෙන් පුද ලබති. සුවර්ණ, අසුර, යක්ෂ, ගාන්ධර්ව යන සත්ත්ව කොට්ඨාසයෝ දේවතා ගණයට ද වැටෙන සෙසු බලසම්පන්න භූම්‍යස්ථ ජීවීහු වෙති.

නාගරාජවරු අතර ලක්දිව චිරප්‍රසිද්ධ වූවෝ මණිඅක්ඛිත නාරජු ය. එතුමන්ගේ වාසභූමිය ද කැලණියයි. තථාගතයන් වහන්සේට කැලණියට වැඩම වීමට ආරාධනා කළ මෙතුමා බුදුරදුන්ගේ තෙවන ලංකාගමනයේ ප්‍රධාන අනුග්‍රාහක දායකයා ද විය.

කැලණි විහාරයේ ස්ථාන දෙකක මෙතුමන්ගේ ප්‍රතිමා දක්නට ලැබේ. ඉන් එකක් පැරැණි විහාර කොටසේ ඉදිරිපස බිත්තියේ මූර්තිමත් කොට ඇති නුවර යුගයට අයත් විශාල ප්‍රමාණයේ (දහඅට රියනක් පමණ වන) ප්‍රතිමාවයි. එහි දෙපස නාග කන්‍යා රූප දෙක් ද විද්‍යමාන ය. දෙවැන්න නව විහාරයේ පිටත බිත්තියේ මූර්තිමත් කොට ඇති නව ප්‍රතිමාවයි. මණිඅක්ඛිත නාරජුන්ගේ ප්‍රතිමාවක් හෝ චිත්‍රයක් වුව ද දක්නට ලැබෙන වෙනත් පූජනීය ස්ථානයක් පිළිබඳ තොරතුරු අප්‍රකට බැවින් මෙම නිර්මාණ ද කැලණි විහාරයට ම සුවිශේෂී වූ නිර්මාණ බව සිතීම නිවැරදි ය.

---

කැලණිය රාජමහා විහාරාධිකාරී
කැලණිය විශ්ව විද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
කථිකාචාර්ය
දර්ශනපති
**දෙනියායේ**
**පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි**

# උතුම් සිල්පද රකිමු අදිටනින් නිරතුරු

**සම්බුදු සසුනක සිසිල විඳින්නට ඉඩ නැති කාලයේදීත් මිනිසුන් සිල්පද රැක්කා. ඒ සීලයේ අනුසස් වින්ද. එහෙත් බුද්ධ ශාසනයක් පවතින කාලයක රකින සීලයක් තුළින් පමණයි නිවන්මඟට මාවත සැකසෙන්නේ.**

අද අප සමාජයේ බොහෝ දෙනා සිතනවා සමාදන් වූ සීලය ටිකක් කැඩුණාට පවක් නැහැ, පුංචි පුංචි සතුන් මැරුවාට, විහිලුවට ඉඳහිට බොරුවක් කිව්වාට පවක් නැහැ. බොරුවක් කියලා තව කෙනෙක් සතුටු කරන එකත් පිනක්. සාදයක දී මත්වතුර පාවිච්චි කළාට අවැඩක් නැහැ කියා කියනවා. එහෙත් සීලය පිළිබඳ අපගේ ශාස්තෘන් වහන්සේ වඩාත් ගැඹුරෙන් විවිධ ආකාරයෙන් වර්ණනා කොට තිබෙනවා.

උන්වහන්සේ විටෙක වදාළා කිරල කිරිල්ලියක් බිත්තර රකිනවා වගේ සිල්පද රකින්න කියලා. ඒ කිරිල්ලිය බිත්තර උඩට ගිහින් පාද උඩට තබාගෙන කෑ ගසමින් සිටින්නේ. ඇයි ඒ? ඇය බයයි අහස කඩා වැටිලා බිත්තර විනාශ වෙයි කියලා. එතරම්ම පරිස්සමට බිත්තර රකිනවා. බුදුරජාණන් වහන්සේ වදාළා කිරලි දෙන බිජු රකිනවා වගේ සිල්පද රකින්න කියලා.

ඒ වගේම සෙමෙර මුවාගේ වටිනාම අංගය ඒ සතාගේ වලිගයයි. සෙමෙර මුවා වලිගය රැක ගන්නේ කෙසේද? ඒ ආකාරයට තමා සමාදන් වූ සිල්පද රකින්න කියලා.

යම් මවකට සිටින්නේ එකම දරුවා නම් ඒ අම්මාගේ මුළු ජීවිතය ම ඒ දරුවා යි. එක් දරුවෙක් ඉන්න අම්මා කෙනෙක් ඒ දරුවා රකිනවා වගේ සමාදන් වූ සිල්පද රකින්න ඕනේ.

එක ඇසක් ඇති මිනිසෙක් ඒ ඇස පරිස්සම් කර ගන්නවා වගේ සිල්පද පරිස්සමට රැක ගන්න ඕනේ. එහෙම නම් ටිකක් මත්වතුර ගත්තාට කමක් නැද්ද? පොඩි බොරුවක් කීවාට කමක් නැද්ද? කියන දේ අපි ම තීරණය කරන්න ඕන දෙයක්.

එක දරුවෙක් සිටින අම්මා කෙනෙක් ඒ දරුවා ටිකක් එහා මෙහා වෙනවාට කැමැති වෙන්නේ නැහැ. ඒ අම්මා හිතන්නේ මගේ දරුවාට හානියක් වෙන්න එපා කියල යි. ඒ වගේ සීලය සමාදන් වූ ඔබත් සිහිකළ යුත්තේ කුඩාවට හෝ මගේ සීලයට හානියක් වෙන්න එපා කියල යි.

අපට පුලුවන් නම් මේ ආකාරයට සිල් රැක ගන්න අපගේ මරණාසන්න මොහොත කෙතරම් නම් ආරක්ෂා සහිත ද? සිල්පද රැකීම තුළ තිබෙන පුණ්‍ය විපාකය අතිශයින්ම බලවත් එකක්. එසේ නම් මේ සිල්පද කැඩීමෙන් අත්වන විපාකය ද ඉතා බරපතළ බවයි ධර්මයේ සඳහන්ව තිබෙන්නේ.

සුචිලෝම කියන ප්‍රේතයාගේ නළලින් ඉදිකටු දහක් ඇතුළට යනවා. කටින් එළියට එනවා. ඔබට එක ඉදිකටුවක් ඇනුණා කියා හිතන්න. වේදනාව කෙතරම් ද? ඒ ප්‍රේතයා කෑ ගසමින් විලාප තියනවා. ඒ ඉදිකටු දහස නැවත බෙල්ලෙන් ඇතුළට යනවා. නැවත පපුවෙන් එළියට එනවා. නැවත බඩෙන් ඇතුළට යනවා. කලවයෙන් එළියට එනවා. ඉන්පසු ඒ ඉදිකටු කොන්දෙන් ඇතුළට යනවා. යටිපතුලෙන් එළියට එනවා. මේ ආකාරයට අනෙක් පැත්තට සිදුවෙනවා. ඒ ප්‍රේතයාගේ ආයුෂය ගනින්න බැරිතරම්. මහත් වූ වේදනාවක් නො නවත්වා ම විඳිනවා. එක ඉදිකටුවක් තත්ත්පරයක් මේ දේ කළා නම් වේදනාව හිතන්න.

දිනක් ඒ ප්‍රේතයා තෙරුන් වහන්සේ නමකට මුණ ගැසුණා. උන්වහන්සේට මහත් අනුකම්පාවක් හටගත්තා ප්‍රේතයා දුටුවිට. උන්වහන්සේ අසනවා ඇයි මේ වගේ දුකක්? කියා.

ස්වාමිනි, මම සසරේ බොහෝ සේ කේලාම් කිව්වා. එහි විපාකයයි මේ. මම කේලාම් කියලා සමගි අය අසමගි කළා. ඒවා බලලා මම සතුටු වුණත් අද විඳින මේ විපාකය ඉතාමත් කටුක යි. දුකයි. මේ දේ අපගේ පියවි ඇසට පෙනෙන්නේ නැහැ. නමුත් ඇත්ත එයයි.

කුඩා සතුටකට දෙදෙනකු බිඳවා මහා විශාල දුකක් හදාගන්නේ ඇයි? අනවශ්‍ය දුකකට පැටලෙන්නේ ඇයි? ඒ නිසා අපි වචනය සංවර කර ගත්තොත්, නිහඬ කර ගත්තොත් සිල්පද ආරක්ෂා කර ගන්න ගොඩාක් පහසුයි.

ඒ වගේම දේශනාවේ සඳහන් වෙනවා යමෙක් දරුණු වචන කීමෙන් නැවත නැවත කීමෙන් මරණින් මතු නිරයේ උපදිනවා. තිරිසන් අපායේ, ප්‍රේත ලෝකයේ යනවා. අඩුම විපාකය ලෙස මනුස්ස ලෝකයට ආ විට කනට අසන්න ලැබෙන්නේ ම අසතුටු වචන. තමන් අකැමැති, හිත රිදෙන, අප්‍රසන්න වචන. එනිසා තමන්ගේ දේපළ රැකගන්න ඕනෑ නම්, දේපළ විනාශ වෙනවට අකැමැති නම්, සොරකම් නොකර සිටින්නට ඕනෑ. හතුරන් ඇතිවෙනාවට අකමැති නම් වැරැදිකාම සේවනය නොකර සිටින්න ඕනෑ. කරුණු රහිතව නින්දා අපහාස අසන්නට කැමැති නැත්නම් බොරු නොකියා ඉන්න ඕනෑ. කවුරුහරි කෙනෙක් තමන්ගේ යහලුවන් බිඳෙනවාට අකැමැති නම් කේලම් නොකියා ඉන්න ඕනෑ.

තමන් සතුටු වචන ම අසන්න ආශානම් කිසිවකුට දරුණු වචන නොකියා සිටින්න ඕනෑ. තමන්ගේ වචන අනෙක් අය විශ්වාස කරනවාට කැමැති නම් බොරු නොකියා ඉන්න ඕනෑ. තමන් උමතු වෙනවාට අකැමැති නම් සුරාපානයෙන් වැළකෙන්න ඕනෑ කියලයි.

**සම්බුද්ධ දේශනාවේ සඳහන් ලෙස යමෙක් දරුණු වචන නැවත නැවත කීමෙන් මරණින් මතු නිරයේ උපදිනවා. තිරිසන් අපායේ, ප්‍රේත ලෝකයේ යනවා. අඩුම විපාකය ලෙස මනුස්ස ලෝකයට ආ විට කනට අසන්න ලැබෙන්නේ ම අසතුටු වචනයි**

එනිසා අල්ප මාත්‍රයක්වත් සිල්පදවලට හානි කර ගන්න එපා. ඉතාමත් පිරිසුදුව රකින්න ඕනේ. කිසිදු කිලුටක් නැතිව තමන් සමාදන් වූ සිල්පද රැකගෙන තමන්ට මේ ලෝකයෙන් මිය යන්න තිබෙනවා නම් එය කෙතරම් යහපතක් ද?

එනිසා ඔබ සමාදන් වූ සිල්පද මේ වන විට කැඩුණා නම්, ඒ පාපයෙන් ගැලවෙන්න කැමැති නම් ළඟම තිබෙන සෑයක්, බෝධින් වහන්සේ නමක් අසලට හෝ නිවෙසේ පිළිම වහන්සේ අසලට හෝ ගොස් බොහෝම ශ්‍රද්ධාවෙන් තෙරුවන් සරණ ගොස් සිල්පද සමාදන්ව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ බිඳුණු සිල්පද සමාදන් වෙන්න. එය අවංකවම කළයුතු දෙයක්.


ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, අද පටන් මම තෙරුවන් සරණ ගොස් සිල්පද රකිනවා, මම මගේ වරද වරදක් ලෙස දැක්කා. ඒ වරදින් අත මිදෙනවා කියා පොරොන්දු වෙන්න.

වරදින් මිදෙන්න තදබල අධිෂ්ඨානයක් ඇතිකර ගන්න. ඉන්පසු දිවි හිමියෙන් ඒ සිල්පද රකින්න. තම පණට වඩා සමාදන් වූ සිල්පදයට ආදරය කරන්න. එතැන් පටන් ඔබ සිල්වත්. තමන් අතින් සිදු වූ වැරැදි අමතක කොට ආයති සංවරයට පත් වූ තැන සිට ඔබ සිල්වත් වෙනවා. එවිට පැරැණි වරදට සිත දොස් කියන්නේ නැහැ. වරදින් නැඟී සිට සිල්වත් ජීවිතයක් ගත කරනවා.

ඉන්පසු ඒ සීලය පිළිබඳ සෑම දිනක ම නින්දට පෙර ආවර්ජනයක් කරන්න. අද දවස පුරාවට ම මම සතෙක් මැරුවේ නැහැ. සොරකම් කළේ නැහැ. වැරැදිකාම සේවනය කළේ නැහැ. බොරු කිව්වේ නැහැ. මත්වෙන දෙයක් පාවිච්චි කළේ නැහැ. මම බුදුරජාණන් වහන්සේ සරණ ගිය ශ්‍රාවකයෙක්, ශ්‍රාවිකාවක් කියලා දිනපතා සතුටු වෙනවා. රකින සීලය සිහි කර කර සතුටු වෙනවා. මේ දුක්ඛිත සසරින් එතෙර වීමට කැමැති බුදුරජාණන් වහන්සේගේ ආර්ය ශ්‍රාවකයා ගමන් කළයුත එකම මාවත ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලයි අපගේ ශාස්තෘන් වහන්සේ වදාළේ. එනිසා අපිත් උතුම් තිසරණය ආරක්ෂා කරමින් සමාදන් වූ සිල්පද රකිමින් මේ දුක්ඛිත සසරින් එතෙර වීමට වහ වහා උත්සාහ කරමු.

නයනා නිල්මිණී





# කැලිෆෝනියා වෙස්ට් සරසවියෙන් ආචාර්ය උපාධිය ලැබූ

# බහුශ්‍රැත පඬිරුවන

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර වැඩම කරනු ලබන්නේ**

**රුහුණු විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති කිරිබත්ගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරාධිපති**

## ආචාර්ය මාකොළ මංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය

**රුහුණු විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති කිරිබත්ගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරාධිපති ආචාර්ය මාකොළ මංගල හිමිපාණන් වහන්සේ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් අගයෙන් අගය කළ යුතු සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් ප්‍රකට ය.**


බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝ නායක පූජ්‍ය වීරගුලේ සරණතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන්, හීන්කෙන්ද පුෂ්පාරාම විහාරාධිපති කැන්දලියැද්දපාළුවේ ධම්මපාල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හා වැලිපිල්ලෑව ශ්‍රී පුරාණ විහාරාධිපති කැන්දලියැද්දපාළුවේ නන්දාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් මාකොළ මංගල යන උතුම් ශාසනික නාමයෙන් 1978 වර්ෂයේ දී මාර්තු මස 15 වන දින උත්තරීතර ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වන්නට තරම් උන්වහන්සේ පුණ්‍යවන්ත වූහ.

ලංකා ශාසනම්බරය ආලෝකවත් කළ දීප්තිමත් පරිවේණාස්ථාන වශයෙන් හැඳින්වෙන නාගර්ජුන ශ්‍රී විද්‍යාපීඨ පිරිවෙන, කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන යන පිරිවෙන්වල වැඩසිටි වියත් ඇදුරු මඬුල්ලක් හමුවේ ශාස්ත්‍රෝන්නතිකාමිත්වයෙන් යුක්තව ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ උන්වහන්සේ කැලණිය විශ්ව විද්‍යාලයෙන් බෞද්ධ දර්ශනය පිළිබඳ මූලික උපාධියත්, දර්ශනපති උපාධියත් ලබා ගත්හ.

භික්ෂූන් වහන්සේ නමක් නිසි වයස එළඹි කල්හි භික්ෂු සමාජය පිළිගන්නා වූ අධිශීල සංඛ්‍යාත සුපරිසුද්ධෝපසම්පදාවට පත්වීමට තරම් උන්වහන්සේ පූර්වෝපචිත කුසලශ්‍රීයෙන් විරාජමාන විය. ඒ පූජ්‍ය කැන්දලියැද්දපාළුවේ නන්දාරාම හිමිපාණන් වහන්සේ හා බැලුම්මහර පඤ්ඤතිස්ස හිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1984 වර්ෂයේ දී ය.

අනතුරුව අමෙරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ආරාධනාවකට අනුව 2005 වර්ෂයේ දී අමෙරිකාවට වැඩම කළ මාකොළ මංගල හිමිපාණෝ 2006 වර්ෂයේ දී අමෙරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයේ වෙස්ට් සරසවියට ඇතුළත්ව උසස් අධ්‍යාපනයට යොමු විය.

කුඩා අවධියේ සිටම ශාස්ත්‍රෝන්නතිකාමිත්වයෙන් යුක්තව ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලැබූ උන්වහන්සේ කැලිෆෝනියා වෙස්ට් සරසවියෙන් බෞද්ධ දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය ද ලබා ගත්හ.




තවද රුහුණු විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපතීන් වහන්සේ වශයෙන් සුවිශාල ධර්ම ශාස්ත්‍රීය සේවයක් සිදු කරන වියත් පඬිරුවනක් වශයෙන් කටයුතු කරන උන්වහන්සේ ශාසනානුලෝමී හැඟීමෙන් යුතුව ශික්ෂාකාමී වියත් සඟ පරපුරක් සම්බුද්ධ ශාසනය වෙත දායාද කිරීමේ උදාර අරමුණින් ශාසනයේ චිරස්ථිතිය අභිවෘද්ධිය පිණිසම කැපවන අග්‍රගණ්‍ය උගත් යතිවරයාණන් වහන්සේ නමකි. “බුදුපිළිමය” ග්‍රන්ථයට අමතරව බෞද්ධ සඟරා විශාල ප්‍රමාණයක් මුද්‍රණය කොට ඇති උන්වහන්සේ පුවත්පත් සඳහා ද ශාස්ත්‍රීය ලේඛන සම්පාදනය කොට ඇත.

විශ්ව විද්‍යාලයේ සේවය කරන භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් අවිවේකී බවක් තිබුණ ද, කිරිබත්ගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ මහා විහාරය කේන්ද්‍ර කරගෙන සමාජය වෙනුවෙන් කළ හැකි සමාජ සේවය නොපිරිහෙළා ඉටු කිරීමට ද කැප වී සිටිති.

විහාරාධිපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ වශයෙන් ලබා දෙන උපදේශකත්වය හා අනුශාසකත්වය මත කිරිබත්ගොඩ තරුණ බෞද්ධ සංගමය, වෙළෙඳ සංගමය හරහා උන්වහන්සේ විශාල සමාජ මෙහෙවරක් ඉටුකරති. වැඩිහිටි නිවාස තුනක අනුශාසකත්වය දරන මාකොළ මංගල හිමියන් ප්‍රදේශය තුළ සුචරිතවත් දරු පරපුරක් ගොඩනැඟීමේ අරමුණ පෙරදැරිව ඉංග්‍රීසි සහ සිංහල යන මාධ්‍ය දෙකෙන්ම 1800 ක සිසු පිරිසක් සිටින දහම් පාසලක් ද පවත්වාගෙන යති. කිරිබත්ගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ මහා විහාරය වන්දනා කිරීමට පැමිණෙන පින්වතුන්ගේ සිත සමාධිගත වන ආකාරයට විහාරස්ථානය තුළ පූජනීයත්වයත් , ශාන්ත පරිසරයත් ආරක්ෂා කර ගැනීමට කටයුතු කර ඇත.

බුද්ධ දේශනාවට අනුව භික්ෂූන් වහන්සේ නමකට උරුම වූ ධර්ම දූත මෙහෙවරෙහි නිරත වීම සඳහා බොහෝ රටවල වැඩම කළ පූජ්‍ය මාකොළ මංගල හිමියන් ලෝකාගමික ශාසනික සේවාවෙහි ද නිරතව සිටින ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් හැඳින්විය හැකි ය. උන්වහන්සේ අමෙරිකාවේ ලොස් ඇන්ජලීස්හි පිහිටා ඇති අමෙරිකන් වියට්නාම බෞද්ධ සංගමයේ අනුශාසකත්වය ද දරති.

**හේමමාලා රන්දුනු**

# ඉවසන හැටි ඉගෙන ගන්න ...

05 පිටුවෙන් ...

“ඔබට අවශ්‍ය ප්‍රමාණයට වඩා සිවුරු ගොඩ ගසා ගන්නට හොඳ නෑ. රාහුල, සරල, සැහැල්ලු ජීවිතය තමයි ඉතා උතුම්. ඔබ හුරුවන්න ඕනෑ එවැනි ජීවිතයකට යි.”

“ඔබේ ඔය ලස්සන මුදු මොළොක් වූ රූපය ලෙඩදුක් පීඩාවලට ගොදුරු වෙනවා. වයස්ගත වන විට හම රැලි වැටී රූපය ජරාවට පත්වෙනවා. එය වෙනස් වෙනවා. ඒ නිසා ඒ ගැන ආශාවක් හිතේ ඇතිකර ගත්තොත් සිදුවෙන්නේ ලෙඩදුක් හැදෙන විට, රූපයේ ලස්සන නැතිවෙලා ජරාව ඉස්මතු වන විට, හිතේ බලවත් දුක් වේදනාවක් හටගැනීම යි. ඒ නිසා ඔබේ රූපය පිළිබඳ ආශාවක් හිතන්න එපා. රාහුල,” යනුවෙන් බුදුපියාණෝ තවදුරටත් පුතුට උපදෙස් දුන්හ.

මගේ පුතා දැන් තුදුස්වියට එළඹිලා ඉන්නේ. නෙත් පිනවන මනහර රූප, කන් පිනවන මිහිරි නාද කෙරේ සිත ඇලෙන, බැඳෙන වයසේ දැන් ඔහු පසුවන්නේ. තම හැඟීම් පාලනය කර නොගෙන පසිඳුරන් හා ගැටෙන අරමුණු පසුපස්සේ ලුහුබැඳ යන්නට ඔහු හුරුපුරුදු වූවොත්, පහන් සිළුවට ආශාවේ ඒ වෙතට ඇදී ගොස් වැනසෙන පළඟැටියකු වාගේ ඔහුත් වැනසෙන්නට පුළුවන්. ඒ නිසා ඉන්ද්‍රිය සංවර කර ගන්නා හැටි පුතාට කියා දිය යුතු යි. තරමක් ගැඹුරු ධර්මය තේරුම් ගන්නට ඔහු දැන් සමර්ථ යැයි බුදුහාමුදුරුවෝ සිතූහ.

“ රාහුල, ඔබේ රූපය ගැන පමණක් නොවෙයි ඇස්, කන්, නාසය ආදී පසිඳුරන්ට අරමුණු වන හැම දෙයක් ගැනම ආශාව නැති කර ගන්න. ඒ හැම දෙයක් ම වෙනස් වෙනවා. විනාශ වෙනවා. ආශා කරන දේවල් වෙනස් වීම හිතට දුකක්.”

“රාහුල, ඔබේ සිතට අරමුණු පසුපස යන්නට ඉඩ නොදී එක්තැන් කර ගන්න. සිත එකඟ කර ගත් විට අනිමිත්ත භාවනාව වඩන්නට පුළුවන්. විදර්ශනා භාවනාව කියන්නේත් අනිමිත්ත භාවනාවට ම යි. සිතේ තිබෙන මාන්නය දුරුකර ගන්නට එය උදව් වෙනවා. මේ ලෝකයේ හැම දෙයක් ම අනිත්‍ය යි. දුක් සහිතයි. මම ය, මගේ ය, මගේ ආත්මය කියලා සැලකිය හැකි කිසිම දෙයක් ඒවා තුළ නෑ. හැම දෙයක් ම ඉඳුරන් රවටන මායාවන් පමණ යි. ඒ පිළිබඳ නොදන්නාකම හෙවත් අවිද්‍යාවත්, අරමුණු කෙරෙහි ආශාවෙන් ඒවා සමඟ බැඳීම හෙවත් තණ්හාවත් නිසා මිනිස්සු සංසාරයේ යළි යළිත් ඉපදෙමින් මැරෙමින් අපමණ දුක් විඳිනවා. ඔබට වුවත් එයට මුහුණ දෙන්නට සිදුවෙනවා. ඒ නිසා රාහුල, ඔබේ හිතේ තිබෙන අවිද්‍යාවත්, තණ්හාවත් නැති කර ගෙන මේ බවයේ දී ම සියලු දුක්වලින් නිදහස් ව රහත් බව ලබා ගන්නට වෑයම් කරන්න.”

බුදුපියාණන් වැදගත් කරුණු රැසක් කියාදීම ගැන රාහුල පොඩි හාමුදුරුවන්ට ඇති වූයේ ලොකු සතුටකි.

“පියාණනි, ඔබ දුන් උපදෙස් සියල්ල ම මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මට හැකි විදියට ඒ සියල්ල ම පිළිපදිනවා” යැයි කියමින් රාහුල පොඩි හාමුදුරුවෝ බුදුපියාණන්ට නමස්කාර කළහ.

“රාහුල, ඔබ අවවාද ගරුක කීකරු කෙනෙක්. ඔබ පැවිදි වූ දවසේ සිට ම වැඩිහිටියන්ගේ අවවාද, අනුශාසනා ඉතා ගෞරවයෙන් පිළිගෙන ඒ අනුව හැසිරෙනවා. ඒ නිසා මේ සසුනේ සියලු භික්ෂූන් අතරින් කීකරුබවින් අග තැන්පත් කෙනා හැටියට ඔබ පත් කිරීමට මම තීරණය කළා.”

“පියාණනි, මට කිසිම තනතුරක් වුවමනා නෑ.” යනුවෙන් එකෙණෙහි ම රාහුල පොඩි හාමුදුරුවන් පැවසුවේ ඉතා නිහතමානි ලෙස ය.

# අත්හැරීමේ චේතනාවෙන්ම දන් දෙන්න



**විසාලා මහනුවර වූ කලි බුදුරජාණන් වහන්සේ වැඩ වසන සමයෙහි උත්තර භාරතයේ පිහිටි සුවිශාල නගරයකි. මේ කියන වකවානුවේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ විශාලා මහනුවර කූටාගාර ශාලාවේ ය. මෙහි විසූ සීහ සේනාපතියා ජෛනාගම ඉතාම භක්තියෙන් අදහාගෙන, නිගණ්ඨනාථපුත්තට දන මානාදියෙන් සංග්‍රහ කරමින් සිටි එම ආගමේ බැතිමත් අනුග්‍රාහකයෙක් විය.**

එක්තරා අවස්ථාවක ලිච්ඡවි රජවරු න් පිරිසක් එකතු වී බුද්ධරත්නයේ ගුණත්, ධම්ම රත්නයේ ගුණත්, සංඝ රත්නයේ ගුණත් ඉතා උත්කර්ෂවත් ලෙස වර්ණනා කරමින් සිටින ආකාරය සීහ සේනාපතිට දැන ගත හැකි විය. ඒ ගුණ ගායනාව අසා සිටි මොහුගේ සිතේ බලවත් ප්‍රසාදයක් ඇතිවිය. පැහැදීම හේතු කොටගෙන බුදුරජාණන් වහන්සේ බැහැදැකීමට යෑමට බලවත් ආශාවක් උපන්නේ ය.

සාමාන්‍ය වශයෙන් තමන් අදහන ආගමෙන් පිටස්තර ශාස්තෘවරයකු හමුවට යෑමට නම් තම ශාස්තෘවරයාගෙන් අවසර ගත යුතු වීම සිරිතක් විය. ඒ නිසා සීහ ද නිගණ්ඨනාථපුත්ත හමුවීමට ගොස් බුදුරජාණන් වහන්සේ දැකීමට යෑමට අදහසක් පහළ වූ බවත්, ඒ නිසා ඒ සඳහා අවසර ලබා ගැනීමට පැමිණි බවත් කියා සිටියේ ය. නිගණ්ඨනාථපුත්ත මොහොතක් කල්පනාකර, යම් කෙනෙක් බුදුරදුන් සමීපයට ගියොත් නම් ආපසු නොඑන බවත්, බුදුරදුන්ට යම් මායා බලයක් ඇති බවත් කියමින් බුදුරදුන් දැකීමට යාමට අවසර නොදී සිටියේ ය. බුදුරදුන් කෙරෙහි පවතින මේ මායා බලය ආවර්තනී මායාව නමින් හැඳින්වෙන බවත් වැඩිදුරටත් පැවසී ය.

සීහ සේනාපති ඉතා ධනවත් ය. මෙබඳු ධනවත් පුද්ගලයකුට බුදුරජාණන් වහන්සේ සමීපයට යන්නට ඉඩ දීමෙන් තමන්ට සිද්ධ වෙන්නේ බලවත් පාඩුවකි. නිගණ්ඨනාථ පුත්ත මහත් භීතියට පත්විය. ඒ නිසා වඩාත් බුදුරදුන් කෙරෙහි කළකිරීම ඇති කරවනු පිණිස බුදුරදුන් අකිරියවාදියකු බව ද කියා සිටියේ ය.

කෙසේ වෙතත් සීහ තම අධිෂ්ඨානය අත් හැරියේ නැත. දෙවැනි වරටත් අවසර ඉල්ලා සිටිමුත් එවර ද අසාර්ථක විය. තුන්වැනි වරට ද අවසර ඉල්ලා සිටියත් ඔහුගෙන් කිසිම ඉඩ හසරක් බුදුරදුන් හමුවීමට යෑමට නොලැබෙන බව දැන ස්වමතය අනුව ම බුදුරජාණන් වහන්සේ වෙත ගියේ ය. බුදුරජාණන් වහන්සේ හමුවට ගිය සීහ “ඔබ වහන්සේ වෙත එන්නට නිගණ්ඨනාථපුත්ත මට ඉඩ නොදුන්නේ ඔබ වහන්සේ “අකිරියවාදියෙක්” යැයි කියන නිසා බව පවසා එය සත්‍යයක්දැ යි විමසී ය. සිත, කය වචනයෙහි සුචරිතය දියුණු කරන අදහසින් අකිරිය නොව කිරියවාදියෙක් යැයි තමන් හට කියන බව බුදුරජාණන් වහන්සේ පැවසූහ.

මෙසේ දහම් කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව සීහ සේනාපති සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. මෙසේ ඵලාධිගමනයෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ මොහුට දේශනා කළේ නිගණ්ඨනාථපුත්තට දුන් දානය නොනවත්වා තව දුරටත් දෙන හැටියටයි. සීහ දැන් මාර්ගඵල ලාභියෙකි. සම්මා දිට්ඨිය ලැබූවෙකි. ආර්ය භූමියට සැපත් වූවෙකි. සීලබ්බත පරාමාස යනුවෙන් හැඳින්වෙන මිසදිටු ඇදහිලි, විශ්වාස බුදු සසුනෙන් පිටස්තර අන් ශාසනයක සරණ යෑමක් නැත. මෙසේ සිටියා වූ මට මිථ්‍යාදෘෂ්ටිකයකුට දන් දෙන්න යැයි බුදුරජාණන් වහන්සේ කියන්නේ කවර කරුණක් නිසාද? ආර්ය භූමියට සැපත් වුවකුට මෙසේ කියන්නේ කුමක් නිසා දැයි සිතට විමතියක් ඇතිවිය. ඒ නිසා ඔහු මේ කාරණය බුදුරජාණන් වහන්සේගෙන් විමසීය.

දන් දෙන්නේ අන් කිසිවක් නිසා නොවෙයි. තණ්හාව නැති කිරීමට යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. මෙහිදී වැදගත් වන්නේ දන් දෙන්නේ කාටද? යන්න නොව දානය කුමක් අරභයා ද යන කාරණයයි. මෙහි කුමක් අරභයා ද යන අදහස ගැඹුරින් විමසිය යුතු ය. බුදු දහමේ මූලික සිද්ධාන්තයක් නම් ‘අත්හැරීම’ යන කාරණයයි. නිර්වාණයට හේතු වන්නේ එයයි. සියල්ලෙන් ම මිදීමට සංසිඳීමට, ලෝකයට අයත් හැම ධර්මතාවයකින් ම මිදී ක්ෂාන්තී දායක වූ නිර්වාණය නිවීම සඳහා උපකාර වන්නේ අතහැරීම හෙවත් තෘෂ්ණාව නැත්තටම නැති කිරීමයි.

බුදුදහමේ එකම අවසාන පරමාර්ථය නැවැත්වීමයි. නවත්වන්නේ කුමක්ද? භව ගමනයි. නිර්වාණය කියන්නේ එයයි. එසේ නම් මේ සඳහා අප මෙතෙක් රැස් කරගෙන සිටි හා රැස් කරන සෑම දෙයක්ම අතහැර දැමිය යුතු ය. දානයෙහි පරම අර්ථය එයයි.

සසර දුකට එකම හේතුව හැටියට චතුරාර්ය සත්‍ය ධර්මයේ ඇතුළත් වන්නේ තෘෂ්ණාවයි. එය මුළුමනින්ම හැර දැමීමට නම් සියල්ල අත්හළ යුතු ය. ඒ නිසා දන් දෙන තැනැත්තා (ප්‍රතිග්‍රාහකයා) නොවෙයි වැදගත් වෙන්නේ. දීමේ පරමාර්ථයයි. සිල්වතුන් සොය සොයා දන්දීමට නොයා යුතු ය. අපට නැති කර ගන්න, ප්‍රහීණ කර ගන්නට තිබෙන්නේ තණ්හාවයි. කාට දන් දුන්නත් එහි පරමාර්ථය විය යුත්තේ සියල්ල අත්හැරීමත්, තණ්හාවට පහර දෙමින් නිර්වාණය කරා ගමන් කිරීමයි.

බුද්ධ දේශනාව අසා සීහ තවදුරටත් පැහැදුණේ තවත් දිනක් විශාලා මහ නුවර කූඨාගාර ශාලාවේ දී ඔහු බුදුරජාණන් වහන්සේගෙන් දානයේ සාන්දෘෂ්ටික ප්‍රතිවිපාක තිබේ දැයි ඇසීය. මේ ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ.

දන් දෙන පුද්ගලයෝ දන් දෙන ආකාරය අනුව තුන් ආකාර වේ. එනම්,

දාන දාස, දාන සහායක හා දානපති යනුවෙනි.

**දාන දාස -**

මොහු දානය පන්සලට යවන්නේ දාසයන් අත ය. නිවසේ දී දානය පිළිගන්වන අවස්ථාවක නම් සේවක සේවකාදීන් ලවා එය පිළියෙල කර ගනී. තමන් භුක්ති විඳින ප්‍රමාණයට වඩා අඩුවෙන් දානය පිණිස දීමට සලස්වයි.

**දාන සහායක -**

අන් පුද්ගලයන් දන් දෙන විට දානය පිළියෙල කරගැනීම ආදිය සඳහා උදව් කරයි. යහළුවන්ටත් තමන් අනුභව කරන ආකාරයට ම සංග්‍රහ කරයි.

**දානපති -**

තමා පරිභෝග කරනවාටත් වඩා හොඳින් දන් දෙයි. සියතින් ම සකසා මැනවින් තමා අතින් ම පිළිගන්වයි. දානයෙහි ආනිශංසස පස් ආකාර වේ.

සමාජයේ කා අතරත් ප්‍රිය මනාප පුද්ගලයකු බවට පත්වේ. මේ ආනිසංස ලබන්නේ දානපතියා ය.

දානය නිසා තව තවත් සත් පුරුෂයන් බොහෝ කොට හඳුනා ගැනීමට අවස්ථාව උදාවෙයි. යහපත් කෙනකුගේ ඇසුර ලබන්නේ තවත් එබඳුම යහපත් කෙනෙක් ම ය.

ප්‍රසන්න වූ කීර්ති රාවයක් පැතිර යයි.

දානපතියාට ඕනෑම සභාවක් මැදට ගිය විට විශාරදයකු සේ නිර්භයව බැබළේ.

මරණින් පසු සුගතිගාමී වී වේ.

සීහ සේනාපතියා මේ බුද්ධ දේශනාව අසා සිට මෙසේ පැවසීය. මේ ආනිශංසවලින් මුල් හතර මට ශ්‍රද්ධාවෙන් තොරව ම පිළිගත හැකිය. එය පිළිගැනීමට මට ශ්‍රද්ධාවක් අවශ්‍ය නොවේ. මුල් ආනිසංස සතරම සාන්දෘෂ්ඨික ය. ප්‍රත්‍යක්ෂ ය. මගේ ජීවිතයෙන් ම මට පෙනී යයි. පස්වැන්න මා පිළිගන්නේ ශ්‍රද්ධාවෙනි. කුමක් නිසාදැයි කිවහොත් මතු ආත්ම භාවය පිළිබඳ ප්‍රත්‍යක්ෂ දැනුමක් මට නැති නිසා ය.

සීහ සේනාපති මනා කොට දන් දුන් කෙනෙකි. මරණින් මතු සුගතිගාමී වන බව පමණක් ප්‍රත්‍යක්ෂ භාවයේ තොර නිසා ශ්‍රද්ධාවෙන් පිළිගත යුතුව මෙන්, අප ද ශ්‍රද්ධාව දියුණු කරගෙන ප්‍රත්‍යක්ෂය කරා යා යුතු ය.

දේශනාව අවසානයේ සීහ සෙන්පතියා අතිශයින් ප්‍රීති ප්‍රමෝදයට පත්විය. ජීවිතයට සතුට ලබා ගැනීමේ එකම මඟ ධර්මය උපයෝගී කර ගැනීමයි. කාට වුවත් ප්‍රශ්නයක් නැත. අත්හැරීමේ චේතනාවෙන් යුතුව ම දීමෙහි නරත වන්න. නිවනට මඟ එය ම වන්නේ ය.

අයන්ති විතාන




## දහමට සිත ...



බුදුන් වැඩිය රට
දහම පිහිටි රට
ලංකා අප රට
මගේම මව් රට

සම්බුදු ගුණයට
පිබිදුණු මගෙරට
තිසරණ සරණට
පෙරටම අපරට

උදේට සවසට
බුදුන් වඳින විට
කරුණා ගුණයට
බණටයි මසිත ම

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**

## වදන් සොයමි

සම්දුනි ඔබේ ගුණ තේජස කියන්නට
සම්දුනි ඔබේ දම් තේජස ලියන්නට
සම්දුනි ඔබේ ඥණයෙ බල කියන්නට
කවියට වදන් නැහැ මේ වග වනන්නට

කිතුල්ගල
**රත්නසේකර රූපසිංහ**

## දස පින් ක්‍රියා

කෙනකුට දේ පුදන හොඳ හිත මුල්ම සෙත
රැකිවිට පිළිවෙතින් යස යහ ගුණය ඇත
දියුණට ගෙනෙන සිත යා යුතු නොසැලි වත
මුල සිට දාන සීලය භාවනා ගත

පින් කොට වෙනත් අයකුට පිදු වගට සෙත
අන් අයගේ කුසල් තමනට ගැනුම ඇත
රත්නත්‍රයට මව්පිය ගුරු පාන හිත
පත්තිය දාන පත්තානය වතා වත

ගරු කටයුතු අයට එම තැන්වලට සෙත
සරු දම් දේශනා ශ්‍රවණය දෙකකි හිත
හුරු දැක්මකින් නිවැරැදි ලොව දකින නෙත
කරුණු මෙලෙස දස පුණ්‍ය ක්‍රියා වෙත

**ජී.බී. ගුණරත්න**
අධ්‍යාපනවේදී, විශ්‍රාමලත් පරිවේණාචාර්ය

## හුදකලාව

ගිය කල එකිනෙක සිතිවිලි ගියා වේ
මතු කල අයත් සැලැසුම් ඔහෙ ගියා වේ
එළඹි මොහොත සිත සන්සුන් වුණා වේ
එය දකිමින් සිටිමු අපි හුදකලා වේ

**බිබිලේ ධම්මසිරි හිමි**
කජුවත්ත ආරණ්‍ය සේනාසනය, දෙහිඅත්තකණ්ඩිය

## අම්මා වන්දනාවේ ගිහින්

මහගෙදර පාලුයි - පිරිත් හඬ නෑසෙයි
වැටගාව මල් පිපුණු - සමන් පිච්ච මල් වැලේ
සමන් මල් වට්ටියකි - මල් නෙළන්නේ නැද්ද
සුළං රැළි අහනවා

වැල් පොටේ වනා ඇති - පුංචි මල් චීත්තය
සුළඟේ වෙළී අතවනයි - මට හරිම දුක හිතෙයි
කුස්සියේ දර ලිප නිවී ඇත
වතුර බොන්නට ගිහින් - කළේ බිඳුණා
තේ ටිකක් බොන්නට ගිහින් - අතක් පිච්චුණා

අම්මා නැති එකම දවසට
හොඳට ම කරදර වුණා
වෙසක් පෝයට අපේ අම්මා
ගිහින් වට වන්දනාවේ

**ලලිතා මැණිකේ**

## මෙත් බුදු හිමියනි

මෙත් බුදු පියාණන් ඉපදුණ යම් දිනෙක
මම ඉපදේවිදෝ යළි දුප්පත් පැලක
පිපි වනමල් නෙළා දෝතට එකින් එක
බුදු සිරිපතුල පුද සරසමි හනික

වනයෙන් වී කොටා සුවඳැල් සහල් තනා
කිරියෙන් රසට රස පිරි කිරිබතක් තනා
රන්වන් තැටි නොමැත මැටි තැටියකට උනා
කිරි ආහාර පුදනව සිත තුටින් පිනා

දෙඅත නළලෙ තබමින් ළඟ දනින් වැටී
දෙනෙත අයා බලනෙමි බණ දෙසන හැටී
මදනල සිසිල ගෙන්වා ගිම් නිවමි කුටී
මට පවසන්න නනිවනට මඟ සොයන සැටී

වෙහෙර පිටිය සිල් සමිතිය
**ඇම්.ඒ. නන්දනී හේමමාලා,**
පොල්ගහවෙල



## සතුට

කරදර හිංසා සතුනට නොකරන්න
ඔබේ පණට මෙන් මෙත්සිත පතුරන්න
මෙදියත උපන් සතහට ජීවත් වෙන්න
අයිතිය තිබේ ඒ බව සිහියට ගන්න

මගේ දෙයක් තවකකු ගතහොත් හොරට
හැගේ දුකක් යළි යළි මාගේ සිතට
අගේ කරන් අන්සතු දේ ගැනීමට
ඇගේ හැපුණ මුත් නොගනිව් මෙතැන් සිට

ඇස, කන, නැහැය, දිව, කය සහ තම මනස
වැරැදි අයුරු පිනවනු හොඳ නැහැ එලෙස
නිවැරැදි හැසිරීම බුදුහිමි දෙසූ විලස
අයහපතක් නොම වේ යහපතක් මිස

ඇත්ත කතාවෙන් පමණක් ඔබගේ සිතිවිලි
තිත්ත කථා බොරුව එපා ඉන් වෙයි පැටලිලි
පැත්ත ගියත් ඇත්ත තමයි වෙන්නේ කලඑළි
චිත්ත සතුට ඉන් ලැබෙනව නොනැගේ මැසිවිලි

**ජේ.ඒ. ජයසිරි**

## යටවීම

ඥානවතුන් ද මෝඩයන් ද ඇලී ගැලීලා
දුප්පතුන් ද පොහොසතුන් ද නොමැත කියාලා
බණ දහම් ද උගත්කම් ද මතට යටවෙලා
පස්වැනි සිල්පදය කඩයි එකට හැපීලා

**ගාමිණී ජයලත් තල්දෙන**

## පමාව

නොකළ දහසක් හොඳ දේ
කළ යුතු
සිතෙනමුත්
ජීවිතේ අග
වෙසෙන මට

නොසිතූ නොපැතූ ලෙස
කිසිම දේකට නොම තබා
ඉඩ
කාලය රුදු ලෙසින්
මා සමඟ කාලය
කා දමා ඇති අයුරු
හරි විස්මය ජනකය

මාලබේ
**කේ.ඩබ්ලිව්. සිරිසේන**

## රාහුල පුතුනි



දෙතිස් ලකුණින්
පිරිපුන්
ඔබේ පියා කුමරුනේ
අර වඩින්නේ සෙනඟ අතරින්
එකසිය අටක් වූ මඟුල් ලකුණින් පිරිපුන්
ඔබෙ පියතුමා
අර වඩින්නේ

දිව ගොස් අතේ දැවටීගෙන
ඉල්ලන්න කුමරුනේ
දායාද ඔබෙ පියාගෙන්

රත්නපුර - ගිලීමලේ -
**ඩී.එස්. ඇඩ්වින් පෙරේරා**

බුදුසරණ
## පහන් සිතක කවි

සම්පූර්ණ නම :- ....................................................
ලිපිනය :- ....................................................
දුරකථන අංකය :- ....................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.